# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,938 — 1970 දෙසැම්බර් 24 වැනි බ්‍රහස්පතින්ද — 1970.12.24

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඬ කරන ලදී)


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 1797 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 1805 | රට බිම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1811 | විවිධ දැන්වීම් ... ... ... | 1812 |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

දීමනා.—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවක් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

3. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ ඡේදකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥා පනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන්, අතුරෙන් දැනටම රාජ්‍ය සේවා සේවාවෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාලවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශෙෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1970 ජූනි මස 2 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

## ආදර්ශ ඉල්ලුම් පත්‍රය

**ආයුර්වේද දෙපාර්තමේන්තුවේ වින්නඹු මාතාවකගේ තනතුරට ඉල්ලුම් කිරීම**

(1) සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

(2) ලිපිනය :————.

(3) ජාතිය :————.

(4) උපන් දිනය හා ස්ථානය (අයදුම්කරුගේ) :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි.)

(5) උපන් දිනය හා ස්ථානය (අයදුම්කරුගේ පියාගේ) :————

(6) විවාහකද ? අවිවාහකද ? (අයදුම්කරු) :————.

(7) අධ්‍යාපනික සුදුසුකම් :————.

(i) සිංහල :————.

(ii) දෙමළ :————.

(iii) ඉංග්‍රීසි :————.

(8) වින්නඹුවක් වශයෙන් ලියාපදිංචි අංකය :————.

(9) පාසැලෙන් අස්වූ දින සිට කරණ ලද සේවයන් පිළිබඳ විස්තර :————. දිනයන් ඇතුළුව :————.

(10) වෙනත් විශේෂ සුදුසුකම් ඇතොත් ඒවායේ විස්තර :————.

(11) මෑතකදී ගත් චරිතය පිළිබඳව සහතිකයන් දෙකක්. (පිටපත් පමණක්)

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

12-920—70.12.24 දින අංක 14,938 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන අමාත්‍යාංශය

**කාර්මික ගුරුවරුන් පුහුණු කිරීමේ I ශ්‍රේණියේ ගුරු පුහුණු උපදේශක තනතුරු**

අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්මික ගුරුවරුන් පුහුණු කිරීමේ ආයතනයේ I වැනි ශ්‍රේණියේ ගුරු පුහුණු උපදේශක තනතුරු සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ඉල්ලුම් කරුවන්ගෙන්, ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘතිපත්‍රය අනුව පිළියෙල වූ අයදුම්පත් 1971.1.15 වැනි දිනට හෝ ඊට පෙර කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තැන (සාමාන්‍ය පරිපාලන ශාඛාව) වෙත ලැබෙන සේ ලියාපදිංචි කරන ලද තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම් කෙළවරේ I ශ්‍රේණියේ ගුරු පුහුණු උපදේශක තනතුර යනුවෙන් සඳහන් කළ යුතුය.

2. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. පත්වීම සාමාන්‍ය වශයෙන් තුන් අවුරුදු ආධුනික කාල සීමාවකට යටත් වේ. දැනට රජයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන නිලධාරියකු තෝරා ගනු ලැබුවහොත් ඔහු නියමිත කාලයක් වැඩ බැලීමේ පදනම මත පත් කරනු ඇත.

3. මෙම තනතුර සඳහා ඉල්ලුම් කරන සෑම අයදුම් කරුවෙකුම පහත දැක්වෙන සුදුසුකම් ඇති බවට පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(i) 1971.1.15 වන දිනට වයස අවුරුදු 30 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි බව, (දැනට රජයේ සේවයේ නියුක්ත නිලධාරීන්ට ඉහළ වයස් සීමාව අදාළ නොවේ.)

(ii) විශිෂ්ඨ චරිතයෙන් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත බව.

(iii) (අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රයෙන්, හෝ

(ආ) දෙකකට නොවැඩි වාර ගණනකදී සිංහල හෝ දෙමළ භාෂාව හා අංක ගණිතය හෝ ගණිතය ඇතුළු විෂය යන් 6 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන්, හෝ

(ඇ) ඊට සමාන හෝ උසස් විභාගයකින් සමත්ව සිටින බව,

සහ

(iv) (අ) ලන්ඩන් සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් ආයතනයේ පහත සඳහන් විෂයයන් ගෙන් එකකින් පූර්ණ උසස් කාර්මික විද්‍යා සහතිකය :—

(i) ලෝහ වැඩ
(ii) ලී වැඩ
(iii) මෝටර් යාන්ත්‍රික විද්‍යාව
(iv) විදුලි ශිල්පය

හෝ

(ආ) ප්‍රායෝගික කාර්මික විද්‍යායතනයේ කණිෂ්ඨ කාර්මික නිලධාරි සහතිකය (යාන්ත්‍රික සහ විදුලි) හෝ හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයේ යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යා පිළිබඳ ඩිප්ලෝමා සහතිකය,

හෝ

(ඇ) සමාන හෝ උසස් සුදුසුකම්,

සහ

(v) එක් අධ්‍යාපන වර්ෂයකට නොඅඩු කාලයක කාර්මික ගුරු පුහුණු පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම,

(vi) අවුරුදු දහසයකට නොඅඩු කාලයක ප්‍රායෝගික හා/හෝ ශිල්පීය මට්ටමේ ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීම,

(vii) සිංහලෙන්/දෙමළෙන් ඉගැන්වීමට හැකියාව තිබිය යුතුයි. නැතහොත් පත්වීම ලැබී අවුරුදු තුනක් ඇතුළත සිංහලෙන්/දෙමළෙන් ඉගැන්වීමට හැකියාවක් ලබා ගත යුතුයි.

4. (i) **මෙම තනතුරට අයත් වැටුප් ක්‍රමය මෙසේය.**— රු. 6,600—8×180—2×240 හා 7×360—11,040 වේ.

(ii) පත්කර ගනු ලබන්නා සෑහෙන ප්‍රායෝගික සහ/හෝ ඉගැන්වීමේ පළපුරුද්දක් ලබා තිබිය යුතු අතර අවුරුදු 10 කට අඩු පළපුරුද්දක් ඇති අයකු තෝරා ගනු ලැබුවහොත්, ඔහු විසින් අවශ්‍ය පළපුරුද්ද ලබාගන්නා තෙක් රු. 6,600 ක නියමිත වාර්ෂික ඒකාබද්ධ වැටුපක් සහිත වැඩ බැලීමේ පදනමක් මත පත් කරණු ඇත.

**සටහන.**—මෙම වැටුප් ක්‍රමයට අනුරූපව 1969.9.30 වැනි දින දක්වා පැවැති වැටුප් ක්‍රමය මෙසේය :— රු. 3,900—9 × 180—8 × 369—8,400 වාර්ෂික වැටුප් ක්‍රමයකි.

5. රජයේ සේවයේ නියුක්ත සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ඉහතින් සඳහන් කළ දිනයට පසුව එවන අයදුම්පත් භාරගනු නොලැබේ. එහෙත් දෙපාර්තමේන්තු ප්‍රධානියාට නියම අවස්ථාවේ දී ලැබී, ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණයක් ඉදිරිපත් කළහොත් පමණක් ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම් පත් භාර ගනු ලැබේ. තවද, සෑම අයදුම් කරුවකුම තම අයදුම් පත්‍රයේ පිටපතක් කෙළින්ම මෙම අමාත්‍යාංශය වෙත එවිය යුතුය.

6. අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන ලියවිලි වල (මුල් පිටපත් නොවේ.) ඉල්ලුම් පත්වල අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතිකය හෝ පාඨශාලා වලට ඇතුළත්වීම සඳහා උපකෘත පාඨශාලා ව්‍යවස්ථාවන්ට අනුව නිකුත් කළ උප්පැන්න සහතිකය භාර ගත නො හැක.)

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන හා වෘත්තීය සහතිකය.

(ඇ) අයදුම්කරුවන්ගේ සුදුසුකම්, චරිතය, හා තනතුරට ඇති සුදුසුකම් පිළිබඳ සහතික 3ක්.

(**සැලකිය යුතුය.**—දැනට රජයේ සේවයේ නියුතු අයදුම් කරුවන් විසින් ඉහත (ඇ) අනුඡේදය අනුව සහතික ඉදිරිපත් කිරීමට නුවුවමනාය.)

7. ඉල්ලුම් පත්‍රය හා අනෙකුත් අදාල ලියකියවිලි, මෙම අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තැනට හැර වෙනත් කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ පළමු වැනි කොටසේ දෙවන ඡේදයේ ආරම්භයේ දැක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත්කිරීම් සම්බන්ධ පොදු කොන්දේසි ද බලනු මැනවි.

9. ඉල්ලුම් පත් ලැබුණු බව දන්වනු ඇත. ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනය පසු වී දින 14 ක් ගෙවුනු කළ පිළිතුරක් නො ලදහොත් වහාම ඒ බව අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත දැන්විය යුතුය. කිසියම් අයදුම් කරුවෙක් මේ අවශ්‍යතාවය පැහැර හැරියොත් තම අයදුම් පත්‍රය සලකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට/ඇයට අහිමිවනු ඇත.

අධ්‍යාපන අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970.12.9 වැනි දින,
කොළඹ 2, මලසි වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

12-873—70.12.24 දින අංක 14,938 දරන ගැසට් පත්‍රය

## විද්‍යෝදය විශ්ව විද්‍යාලය

### සහකාර කථිකාචාර්ය—භූගෝල විද්‍යාව

ඉහත සඳහන් තනතුර සඳහා මවිසින් අයදුම්පත් 1971.1.9 දක්වා බාරගනු ලැබේ.

සියල්ල අඩංගු මාසික දීමනාව : රු. 700—4×30—රු. 820.

ලිපිනය ලියා මුද්දර ගැසූ 9"×4" ලියුම් කවරයක් සහිතව ලිපියක් විශ්ව විද්‍යාලය කාර්යාලයට එවීමෙන් සම්පූර්ණ විස්තර සහ ඉල්ලුම්පත් ලබාගත හැකිය.

වැඩබලන ලේකම්.

1970 දෙසැම්බර් 16,
නුගේගොඩ.

12–947—70.12.24 දින අංක 14,938 දරන ගැසට් පත්‍රය

---

## පරිපාලන අභ්‍යාස ආයතනය

### බදු පරිපාලනය පිළිබඳ ජාත්‍යන්තර අධිශිෂ්‍යත්වය 1971/72, අධ්‍යයන වර්ෂය—හාවර්ඩ් නීති විද්‍යාලය

ඇමෙරිකා එක්සත් ජනපදයේ, හාවර්ඩ්හි, ඉහත සඳහන් ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා ලංකා පරිපාලන සේවයේ සාමාජිකයන්ගෙන් අයදුම් පත්‍ර කැඳවනු ලැබේ.

**කාලය.**—1971/72 අධ්‍යයන වර්ෂය.

**සුදුසුකම්.**—(i) වයස අවුරුදු 28-30 දක්වා.

(ii) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් තිබිය යුතු අතර, මාණ්ඩලික ශ්‍රේණියේ අවුරුදු පහක පළපුරුද්දක් තිබිය යුතුය.

(iii) තෝරා ගනු ලබන සෑම අපේක්ෂකයෙකු විසින් ම අංක 627 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව ගිවිසුමක් අත්සන් කළ යුතුය.

**පාඨමාලාවේ අරමුණු :—**

(i) සංවර්ධනය වන රටවල ආදායම් බදු ප්‍රතිසංස්කරණ

(ii) බදු පරිපාලනය

(iii) බදු පිළිබඳ නීතිය

**ප්‍රදානයේ කොන්දේසි :—**

(i) ඇමෙරිකා එක්සත් ජනපදයට යාම හා ඒම පිළිබඳ ගමන් ගාස්තු

(ii) ජීවන හා ගමන් වියදම් ගෙවීම

(iii) ඇඳුම් දීමනාවක්

**අයදුම්පත්‍ර.**—පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රය අනුව සාරානුකූලව පිළියෙල කළ අයදුම්පත් අදාළ ස්ථිර ලේකම්ගේ මාර්ගයෙන් කොළඹ 7, ලෝංඩන් පෙදෙස අංක 28/10 හි පරිපාලන අභ්‍යාස ආයතනයේ අධ්‍යක්ෂ වෙත 1971 ජනවාරි 22 වෙනි දිනට පෙර ලැබෙන සේ එවිය යුතුයි. පමාවී ලැබෙන ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

එච්. එස්. වනසිංහ,
අධ්‍යක්ෂ, පරිපාලන අභ්‍යාස ආයතනය.

1970 දෙසැම්බර් 16,
පරිපාලන අභ්‍යාස ආයතනය,
28/10, ලෝංඩන් පෙදෙස,
කොළඹ 7.

### ඇමෙරිකා එක්සත් ජනපදයේ පුහුණුව සඳහා අයදුම්පත් ආකෘතිය

#### I වැනි කොටස

(1) අයදුම් කර සිටින පාඨ මාලාව :————.

(2) නිලධාරියාගේ නම (අග නම මුලට) :————.

(3) උපන් දිනය :————.

(4) සේවය හා ශ්‍රේණිය :————.

(5) රාජ්‍ය සේවයට බැඳුනු දිනය :————.

(6) රාජ්‍ය සේවයේ දැරූ තනතුරු සහ දින වකවානු :————.

(7) ශාස්ත්‍රීය සුදුසුකම් :————.

(8) භාෂා ප්‍රවීණත්වය :————.

(9) නිලධාරියා සහභාගි වී ඇති විදේශ අභ්‍යාස පාඨමාලා, සම්මන්ත්‍රණ, සාකච්ඡා සම්මේලන ආදියේ විස්තර :————.

(10) නිලධාරියා ලංකාවේදී හදාරා ඇති අභ්‍යාස පාඨමාලා හෝ වෙනත් ශාස්ත්‍රීය කටයුතු පිළිබඳ විස්තර :————.

(11) නීතිය පිළිබඳ උපාධියක් ලබා ඇත්නම් ඒ පිළිබඳ විස්තර :—

(12) ඉහත 9 වෙනි හා 10 වෙනි අංකයන් යටතේ දක්වා ඇති කටයුතුවල ප්‍රතිඵලයක් වශයෙන් යම් විශේෂ කාර්ය ක්ෂෙත්‍රයක නිලධාරියා ඇති කර ඇති වෙනස්කම් හා වැඩි දියුණු කිරීම පිළිබඳ විස්තර :————.

මා විසින් සපයා ඇති ප්‍රකාශයන් මගේ හොඳම විශ්වාසයේ හැටියට සත්‍ය බවත් නිවැරදි බවත්,................................වන මම සහතික කරමි.

පුහුණුව සඳහා පිළිගනු ලැබුවහොත්, ලංකා රජය සඳහා හා ඒ වෙනුවට පරිපාලන අභ්‍යාස අධ්‍යක්ෂ විසින් නියම කරනු ලබන උපදෙස් පිළිපැදීමටත් කොන්දේසිවලට අනුව ක්‍රියා කිරීමටත් මම පොරොන්දුවෙමි.

දිනය :————. අත්සන :————.

#### II වැනි කොටස

................................ දෙපාර්තමේන්තුවේ ................
(පදවි නාමය)

................................................ මහතාගේ අයදුම් පත
(නම)

නිර්දේශ කර ඉදිරිපත් කරමි. තෝරා ගනු ලැබුවහොත් අභ්‍යාස පාඨමාලාව හැදෑරීම සඳහා මුදා හරිනු ලැබේ.

................................අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

දිනය :————.

12–918—70.12.24 දින අංක 14,938 දරන ගැසට් පත්‍රය

---

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පොළ හත්පත්තුවේ කුලියාපිටිය ප්‍රා.ආ.නි. කොට්ඨාශයේ යටිකහ දකුණු කෝරළයේ හදිසි මරණ පරීක්ෂක ධුරය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පොල හත්පත්තුවේ කුලියාපිටිය ප්‍රා.ආ.නි. කොට්ඨාශයේ යටිකහ දකුණු කෝරළයේ හදිසි මරණ පරීක්ෂක ධුරය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට ඉල්ලුම් පත් ඉදිරිපත් කරන ලෙස මෙයින් ඉල්ලා සිටිමි.

පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ අන්දමට සකස් කරන ලද අයදුම්පත් 1971.1.26 වන දිනට හෝ ඊට පෙර, පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ එවිය යුතුයි :—

"දිසාපති, කච්චේරිය, කුරුණෑගල."

2. මෙම තනතුර සඳහා වැටුපක් ගෙවනු නොලැබේ. එක් එක් හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රු. 7.50 ක දීමනාවක් බැගින් ගෙවනු ලැබේ.

3. පහත සඳහන් සුදුසුකම් තිබෙන බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) ඉල්ලුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 30 කට නොඅඩු හා 60 කට නොවැඩිවීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්තවීම.

(ඇ) ඉල්ලුම්කරු ඉහතකී කෝරළයේ ස්ථිර පදිංචිකරුවකු වීම.

(ඈ) යටත් පිරිසෙයින් සිංහල හෝ ඉංග්‍රීසි VII වන ප්‍රමාණයෙන් වත් සමත්වී සිටීම.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු ය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක්.

5. රජයේ සහ සංස්ථාවල සේවකයන්ද, පළාත් පාලන ආයතනවල නියෝජිතයින්ද මෙම තනතුර සඳහා ඉල්ලුම් පත් එවීමට නුසුදුස්සෝ වෙති. ඔවුන්ගේ ඉල්ලුම් පත්‍ර භාරගනු නොලැබේ.

6. ඉල්ලුම් පත් ලැබුණු බවට දැන්වීමක් කරනු නොලැබේ. අයදුම් පත් ලේඛනගත තැපෑලෙන් එවිය යුතුවේ.

7. කුලියාපිටිය ප්‍රා.ආ.නි. කොට්ඨාශයේ යටිකහ දකුණු කෝරලේ හදිසි මරණ පරීක්ෂක ධුරය සඳහා 1970.9.19 වැනි දින පැවැත්වූ සම්මුඛ පරීක්ෂණය අවලංගු කළා සේ සැලකිය යුතුයි.

හී. බ. දිසානායක,
කුරුණෑගල දිසාපති.

1970 දෙසැම්බර් මස 15 දා,
කුරුණෑගල, දිසාපති කාර්යාලයේ දී ය.

**කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පොළ හත්පත්තුවේ කුලියාපිටිය ප්‍රා.ආ.නි. කොට්ඨාශයේ යටිකහ දකුණු කෝරළයේ හදිසි මරණ පරීක්ෂක ධුරය**

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පෙළපතේ නාමය සමග පැහැදිළි අකුරින්) :————.
2. ලිපිනය :————.
3. ස්ථිර පදිංචි ස්ථානය හා එහි පදිංචි කාලය :————.
4. (අ) අයදුම් පත් භාරගන්නා අවසාන දිනට සම්පූර්ණ වයස :————.

   (ආ) උපන් දිනය සහ ස්ථානය :————.
5. විවාහක අවිවාහක බව :————.
6. අධ්‍යාපන සුදුසුකම් :————.
7. දැනට කරන රක්ෂාව :————.
8. මීට පෙර රැකියාවක් කළේද ? එසේ නම් එය පිළිබඳ විස්තර :————.
9. තමන් සතු දේපොළවල වටිනාකම් සහ ප්‍රමාණයන් විස්තර සහිතව :————.
10. ඉල්ලුම්කරු ණයගැතිව සිටීද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.
11. ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට වරදකරුවී අධිකරණයක් මගින් දඬුවම් ලබා තිබේද ? :————.
12. මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.

..........................................
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

12–921—70.12.24 දින අංක 14,938 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ දිස්ත්‍රික්කයේ ග්‍රාමසේවක සේවයට බඳවා ගැනීම

කොළඹ දිස්ත්‍රික්කයේ ග්‍රාමසේවක සේවයේ තිබෙන ඇබෑර්තු පිරවීම සඳහා 1970 නොවැම්බර් 20 වැනි දින අංක 14,933 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරණ ලද නිවේදනය පහත සඳහන් පරිදි සංශෝධනය කරන්නට යෙදුන බව දන්වමි.

4. **සුදුසුකම්.**—(IV) අනු ඡේදය සම්පූර්ණයෙන්ම අස්කර මෙසේ යෙදිය යුතුය.

(IV) අපේක්ෂකයන්ට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුය :—

(ඒ) සිංහල හෝ දෙමළ භාෂාව සහ අංක ගණිතය හෝ ගණිතය යන විෂයයන්ගෙන් සාමාර්ථයන් ද ඇතුළුව අඩු තරමින් විෂයයන් දෙකකින් සම්මාන සාමාර්ථ සහිත ලංකා ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය, හෝ

(බී) සිංහල හෝ දෙමළ භාෂාව සහ අංක ගණිතය හෝ වාණිජ අංක ගණිතය හෝ මූලික ගණිතය හෝ ශුද්ධ ගණිතය යන විෂයයන්ගෙන් සාමාර්ථයන් ද ඇතුළුව අඩු තරමින් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් හයකින්, දෙවරකට නොවැඩි වාර ගණනකදී ලබාගත් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) සහතිකය, හෝ

(සී) විෂයයන් හතරක් සහිත අධ්‍යයන පොදු සහතික පත්‍රය (උසස් පෙළ) හෝ උපාධියක් වැනි උසස් සුදුසුකම්.

**සටහන.**—සිංහල කථා කරන ග්‍රාම සේවක කොට්ඨාශ වල ග්‍රාම සේවක තනතුරු සඳහා ඉදිරිපත් වන අපේක්ෂකයන් සිංහල භාෂාව ද දෙමළ කථා කරන ග්‍රාම සේවක කොට්ඨාශ වල ග්‍රාම සේවක තනතුරු සඳහා ඉදිරිපත් වන අපේක්ෂකයන් දෙමළ භාෂාව ද ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේදී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී හෝ සමත් වී සිටිය යුතුය.

(VI) **අනුඡේදය.**—මෙය සම්පූර්ණයෙන් ඉවත් කර මෙසේ යෙදිය යුතුය.

(VI) (අ) අයැදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පූර්ව කිට්ටුම වර්ෂ හයක කාල සීමාව ඇතුළත අපේක්ෂකයාට තමා පත්වීම බලාපොරොත්තු වන පාලන දිස්ත්‍රික්කය තුළ අඩු තරමින් වර්ෂ තුනක්වත් අඛණ්ඩ ස්ථිර පදිංචියක් තිබිය යුතුය. මෙයට සාක්ෂි වශයෙන් ග්‍රාම සේවකගෙන් ලබා ගත් පදිංචිය පිළිබඳ සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. ගෘහ මූලික ලැයිස්තු, මැතිවරණ ඡන්දදායක ලැයිස්තු වැනි ලියවිලි ද මේ සඳහා ඉදිරිපත් කළ හැකිය ; නැතහොත්

(ආ) අපේක්ෂකයා පුරප්පාඩු ඇතිවන පාලන දිස්ත්‍රික්කය තුළ උපන් අයෙක් විය යුතුය. ඒ සඳහා තම අයිතිය තහවුරු කිරීම පිණිස ඔහුගේ උප්පැන්න සහතිකය ඉදිරිපත් කළ යුතුය ; නැතහොත්

(ඇ) පුරප්පාඩු ඇතිවන පාලන දිස්ත්‍රික්කය තුළ පිළිවෙලින් අවුරුදු පහකට නොඅඩු කාලසීමාවක් ස්වකීය ඉගෙනීම කර තිබිය යුතුය. මෙම අයිතිය තහවුරු කිරීම පිණිස විදුහල්පතිතුමාගෙන් ලබාගත් පාඨශාලා සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

**සටහන.**—දෙමව්පියන් කලින් කල මාරුවීයාම හේතු කොට ගෙන පදිංචිය පිළිබඳ සුදුසුකම් සනාථ කිරීමට අපොහොසත් වන මාරුවීම් සහිත සේවාවල නියුක්ත නිලධාරීන්ගේ දරුවන් අපේක්ෂකයින් ලෙස ඉදිරිපත් වූ විට එම අපේක්ෂකයාගේ ස්ථිර පදිංචි ස්ථානය ලෙස මවගේ හෝ පියාගේ උපන් ස්ථානය සැලකිය හැක.

7. **සම්මුඛ පරීක්ෂණය.**—මෙම ඡේදය සම්පූර්ණයෙන්ම අස්කර මෙසේ යෙදිය යුතුය.

7. **සම්මුඛ පරීක්ෂණය.**—(i) ලකුණු 100 ක් වෙන් කෙරෙන සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වෙනු ඇත. මෙම සම්මුඛ පරීක්ෂණයේදී අපේක්ෂකයාගේ පෙනුම, පෞරුෂත්වය, නායකත්වය පිළිබඳ ගුණාංග, චරිතය, කීර්තිය සහ බුද්ධියත්, සාමාන්‍ය වශයෙන් පළාතේ තොරතුරු පිළිබඳව අපේක්ෂකයාගේ දැනුමත් සැලකිල්ලට ගෙන ලකුණු වෙන් කෙරෙනු ඇත. ගමට සහ ගමේ සුභ සාධනයට අදාළ කරුණු පිළිබඳව අපේක්ෂකයාගේ දැනුම නිශ්චය කිරීම සඳහා ප්‍රශ්න අසනු ඇත.

(ii) ලකුණු ප්‍රමාණ කිරීමේ ක්‍රමය යටතේ කුසලතා අනුව වැඩිම මුළු ලකුණු සංඛ්‍යාවක් ලබාගත් අපේක්ෂකයන් පමණක් එක් එක් පාලන දිස්ත්‍රික්කයෙන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

(iii) පහත (අ) සහ (ආ) ඡේදයන් යටතේ සුදුසුකම් ලබන අපේක්ෂකයන් සංඛ්‍යාවෙන් වැඩි කවර සංඛ්‍යාවක් හෝ අනුව සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අපේක්ෂකයන්ගේ සංඛ්‍යාව නිශ්චය කෙරෙනු ඇත.

(අ) සම්මුඛ පරීක්ෂණය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණයෙන් (100න්) ලබා ගන්නා උපරිම ලකුණු සංඛ්‍යාව සහ ලකුණු ප්‍රමාණ කිරීමේ ක්‍රමය අනුව ලබා ගන්නා ලකුණු සංඛ්‍යාව ද එක්ව ගත් කළ පත්වීමක් සඳහා සලකා බැලීමට ප්‍රමාණවත් ලකුණු සංඛ්‍යාවක් ලබාගෙන නැති අපේක්ෂකයන් කිසිවෙක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබීමට සුදුස්සන් නොවනු ඇත.

**නිදර්ශනයක්.**—ඇබෑර්තු 10 ක් තිබේ නම් සහ ලකුණු ප්‍රමාණ කිරීමේ ක්‍රමය යටතේ කුසලතා අනුව දහවැනියා ලබා ඇති මුළු ලකුණු ප්‍රමාණය 340 නම් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබීමට සුදුස්සන් වීම පිණිස අපේක්ෂකයින් විසින් ලකුණු ප්‍රමාණ කිරීමේ ක්‍රමය යටතේ අඩු වශයෙන් ලකුණු 240 ක් වත් ලබාගත යුතුය.

(ආ) එක් එක් පාලන දිස්ත්‍රික්කයේ පවත්නා ඇබෑර්තු සම්බන්ධයෙන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන මුළු අපේක්ෂකයින්ගේ සංඛ්‍යාව පහත ගෙනහැර දක්වා ඇති ඇබෑර්තු සංඛ්‍යාවේ ගුණිතයකට නොඅඩු සංඛ්‍යාවක් වනු ඇත :—

| ඇබෑර්තු සංඛ්‍යාව | | සම්මුඛ පරීක්ෂණයට කැඳවිය යුතු සංඛ්‍යාව |
|---|---|---|
| 5 ක් හෝ ඊට අඩු | ... | 75 |
| 6 සිට 10 දක්වා | ... | 120 |
| 11 සිට 15 දක්වා | ... | 150 |
| 16 සිට 20 දක්වා | ... | 160 |
| 21 සිට 25 දක්වා | ... | 175 |
| 26 සිට 30 දක්වා | ... | 180 |
| 31 සිට 35 දක්වා | ... | 185 |

(iv) අපේක්ෂකයන් විසින් පහත 10 (iii) වැනි ඡේදයේ සඳහන් සහතික වල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

(v) ඉහත දක්වා ඇති මිණුම් දණ්ඩ යටතේ සුදුසුකම් නොලබන අපේක්ෂකයන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු නොලැබේ. අපේක්ෂකයකු සම්මුඛ පරීක්ෂණයට කැඳවනු නොලබනුයේ ඔහු සුදුසුකම් නොලබා ඇති නිසාය.

අයදුම් පත් භාර ගැනීමේ අවසාන දිනය 1971 ජනවාරි 10 වන දින දක්වා දීර්ඝ කර ඇති බව දන්වමි.

ඩ. වි. ද අල්විස්,
කොළඹ දිස්ත්‍රික්කයේ දිසාපති.

කච්චේරිය,
කොළඹ, 1970.12.14.

12–970 –70.12.24 දින අංක 14,938 දරන ගැසට් පත්‍රය

## බදුල්ල දිස්ත්‍රික්කයේ බිංතැන්න බටහිර කොට්ඨාශය

### උප්පැන්න හා මරණ සහ බිංතැන්න කොට්ඨාශයේ විවාහ (උඩරට හා සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය

බිංතැන්න බටහිර උප්පැන්න හා මරණ ලියා පදිංචි කිරීමේ කොට්ඨාශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතු කොට ගෙන ගම් වාසීන්ගෙන් සැලකුම් ලබන ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු විසි එකකට නො අඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියළු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශිය ආදායම් නිලධාරි කාර්යාල, ග්‍රාමසේවක කාර්යාල, පළාත් පාලන ආයතන කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොලවල්, සහ සමුපකාර කඩ සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කාර්යාලවල, ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් වල ඇතුළත් වේ

3. සියළුම ඉල්ලුම් පත් මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1971 ක් වූ පෙබරවාරි මස 26 වැනි දින හෝ එදිනට පෙර මා වෙත ලැබෙන සේ ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

බ. සු. විජේවීර,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්.

1970 ක් වූ දෙසැම්බර් මස 2 වන දින,
බදුල්ලේ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ දීය.

12-887—70.12.24 දින අංක 14,938 දරන ගැසට් පත්‍රය

---

## ලංකාවේ කාර්මික සහ කම්මාන්ත ණය සංස්ථාව

### කායිකල කම්කරු තනතුර

මෙම සංස්ථාවේ සේවයෙහි ඉහතකී තනතුර සඳහා ඉල්ලුම්පත්‍ර, සුදුසුකම් ඇති කොළඹ පදිංචි ඉල්ලුම්කරුවන්ගෙන්, භාරගනු ලැබේ. සෑම ඉල්ලුම්පතක්ම 1971. 1. 8 දිනට හෝ ඊට පෙර ලැබෙනසේ සාමාන්‍යාධිකාරි වෙත එවිය යුතුයි.

සේවයේ ස්ථිර කලාසින් පසුව මෙම තනතුරට රු. 55—8×2.50 9×3, 1×4—රු. 106 පරිමාණය අනුව මාසික වැටුප් ගෙවනු ලැබේ. මෙම වැටුපට අමතරව සංස්ථාවේ ක්‍රමය අනුව ජීවනාධාර සහ ගෙවල් කුලී දීමනාවන් ද ගෙවනු ලැබේ. නමුත් තනතුර ප්‍රථමයෙන් තාවකාලික සහ අනියම් වන හෙයින් ස්ථිර කරන තුරු දිනකට රු. 1.33 බැගින් වේතන ගෙවනු ලැබේ.

සෑම ඉල්ලුම්කරුවෙක්ම 1971. 1. 8 දිනට වයසින් අවුරුදු 18 කට අඩු නොවිය යුතු අතර අවුරුදු 28 කට වැඩි නොවිය යුතුයි. තවද, ඉල්ලුම්කරු විශිෂ්ඨ චරිතයෙන් සහ යහපත් සෞඛ්‍ය තත්ත්වයෙන් සිටිය යුතුයි. උප්පැන්න සහතිකය ඇතුළු 7 වැනි ප්‍රමාණය සමත්වූ බවට අධ්‍යයන සහතිකය ඔහු විසින් ඉදිරිපත් කළ යුතුයි.

හි. සැ. පො. ගුණවර්ධන,
සාමාන්‍යාධිකාරී.

1970 දෙසැම්බර් 18 වැනිදා,
තැ. පෙ. 20,
292, ගාලු පාර,
කොළඹ 3.

12-972—70.12.24 දින අංක 14,938 දරන ගැසට් පත්‍රය

---

## ග්‍රාම සේවක සේවයට බඳවාගැනීම

නුවරඑළිය දිස්ත්‍රික්කයේ ග්‍රාම සේවක සේවයේ ඇබෑර්තු 13ක් පිරවීම සඳහා ඉල්ලුම්පත් කැඳවමින් ම විසින්, 1970 නොවැම්බර් මස 20 වැනි දින අංක 14,933 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය පහත සඳහන් අයුරු සංශෝධනය කරමි. මෙහි අංක යොදා ඇත්තේ යථෝක්ත ගැසට් නිවේදනයේ අංක යොදා ඇති අනුපිළිවෙල අනුව බව සැළැකිය යුතු ය :—

4. **සුදුසුකම්.**—(iv) අනු ඡේදය සම්පූර්ණයෙන් ම අස් කර මෙසේ යෙදිය යුතුය :—

(iv) අපේක්ෂකයන්ට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතු ය :—

(ඒ) සිංහල හෝ දෙමළ භාෂාව සහ අංක ගණිතය හෝ ගණිතය යන විෂයයන්ගෙන් සාමාර්ථයන් ද ඇතුළුව අඩු තරමින් විෂයයන් දෙකකින් සම්මාන සාමාර්ථ සහිත ලංකා ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය, හෝ

(බී) සිංහල හෝ දෙමළ භාෂාව සහ අංක ගණිතය හෝ වාණිජ අංක ගණිතය හෝ මූලික ගණිතය හෝ ශුද්ධ ගණිතය යන විෂයයන්ගෙන් සාමාර්ථයන් ද ඇතුළුව අඩුතරමින් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් හයකින්, දෙවරකට නොවැඩි වාර ගණනක දී ලබාගත් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) සහතිකය, හෝ

(සී) විෂයයන් හතරක් සහිත අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) හෝ උපාධියක් වැනි උසස් සුදුසුකම්.

**සටහන.**—සිංහල කථා කරන ග්‍රාම සේවක කොට්ඨාශවල ග්‍රාම සේවක තනතුරු සඳහා ඉදිරිපත් වන අපේක්ෂකයන් සිංහල භාෂාව ද, දෙමළ කථා කරන ග්‍රාම සේවක කොට්ඨාශවල ග්‍රාම සේවක තනතුරු සඳහා ඉදිරිපත් වන අපේක්ෂකයන් දෙමළ භාෂාව ද ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී හෝ සමත් වී සිටිය යුතු ය.

(vi) **අනුඡේදය.**—මෙය සම්පූර්ණයෙන් ඉවත් කර මෙසේ යෙදිය යුතු ය :—

(vi) (අ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පූර්ව කිට්ටුම වර්ෂ හයක කාලසීමාව ඇතුළත අපේක්ෂකයාට තමා නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ අඩුතරමින් වර්ෂ තුනක් වත් අඛණ්ඩ ස්ථිර පදිංචියක් තිබිය යුතුය. මෙයට සාක්ෂි වශයෙන් ග්‍රාම සේවකගෙන් ලබාගත් පදිංචිය පිළිබඳ සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. ගෘහ මූලික ලැයිස්තු, මැතිවරණ ඡන්දදායක ලැයිස්තු වැනි ලියවිලිද මේ සඳහා ඉදිරිපත් කළ හැකි ය ; නැතහොත්

(ආ) අපේක්ෂකයා නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ උපන් අයෙකු විය යුතුය. ඒ සඳහා තම අයිතිය තහවුරු කිරීම පිණිස ඔහුගේ උප්පැන්න සහතිකය ඉදිරිපත් කළ යුතු ය ; නැතහොත්

(ඇ) නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ පිළිවෙලින් අවුරුදු පහකට නොඅඩු කාලසීමාවක් ස්වකීය ඉගෙනීම කර තිබිය යුතුය. මෙම අයිතිය තහවුරු කිරීම පිණිස විදුහල්පතිතුමාගෙන් ලබාගත් පාඨශාලා සහතිකයක් ඉදිරිපත් කල යුතු ය.

**සටහන.**—දෙමව්පියන් කලින් කල මාරුවී යාම හේතුකොට ගෙන පදිංචිය පිළිබඳ සුදුසුකම් සනාථ කිරීමට අපොහොසත් වන මාරුවීම් සහිත සේවාවල නියුක්ත නිලධාරීන්ගේ දරුවන් අපේක්ෂකයින් ලෙස ඉදිරිපත් වූ විට එම අපේක්ෂකයාගේ ස්ථිර පදිංචි ස්ථානය ලෙස මවගේ හෝ පියාගේ උපන් ස්ථානය සැළැකිය හැක.

7. **සම්මුඛ පරීක්ෂණය.**—මෙම ඡේදය සම්පූර්ණයෙන්ම අස් කර මෙසේ යෙදිය යුතුය.

7. **සම්මුඛ පරීක්ෂණය.**—(i) ලකුණු 100ක් වෙන් කෙරෙන සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වෙනු ඇත. මෙම සම්මුඛ පරීක්ෂණයේ දී අපේක්ෂකයාගේ පෙනුම, පෞරුෂත්වය, නායකත්වය පිළිබඳ ගුණාංග, චරිතය, කීර්තිය සහ බුද්ධියත්, සාමාන්‍ය වශයෙන් පළාතේ තොරතුරු පිළිබඳව අපේක්ෂකයාගේ දැනුමත් සැළකිල්ලට ගෙන ලකුණු වෙන් කෙරෙනු ඇත.

ගමට සහ ගමේ සුභසාධනයට අදාළ කරුණු පිළිබඳව අපේක්ෂකයාගේ දැනුම නිශ්චය කිරීම සඳහා ප්‍රශ්න අසනු ඇත.

(ii) ලකුණු ප්‍රමාණ කිරීමේ ක්‍රමය යටතේ කුසලතා අනුව වැඩිම මුළු ලකුණු සංඛ්‍යාවක් ලබාගත් අපේක්ෂකයන් පමණක් මෙම දිස්ත්‍රික්කයෙන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

(iii) පහත (අ) සහ (ආ) ඡේදයන් යටතේ සුදුසුකම් ලබන අපේක්ෂකයන් සංඛ්‍යාවෙන් වැඩි කවර සංඛ්‍යාවක් හෝ අනුව සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අපේක්ෂකයන්ගේ සංඛ්‍යාව නිශ්චය කෙරෙනු ඇත :—

(අ) සම්මුඛ පරීක්ෂණය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණයෙන් (100ක්) ලබාගන්නා, උපරිම ලකුණු සංඛ්‍යාව සහ ලකුණු ප්‍රමාණ කිරීමේ ක්‍රමය අනුව ලබාගන්නා ලකුණු සංඛ්‍යාවද එක්ව ගත් කල පත්වීමක් සඳහා සලකා බැලීමට ප්‍රමාණවත් ලකුණු සංඛ්‍යාවක් ලබාගෙන නැති අපේක්ෂකයන් කිසිවෙක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබීමට සුදුස්සන් නොවනු ඇත.

**නිදර්ශනයක්.**—ඇබෑර්තු 10ක් තිබේනම් සහ ලකුණු ප්‍රමාණ කිරීමේ ක්‍රමය යටතේ කුසලතා අනුව දහවැනියා ලබා ඇති මුළු ලකුණු ප්‍රමාණය 340 නම් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබීමට සුදුස්සන් වීම පිණිස අපේක්ෂකයින් විසින් ලකුණු ප්‍රමාණ කිරීමේ ක්‍රමය යටතේ අඩු වශයෙන් ලකුණු 240ක් වත් ලබාගත යුතුය.

(ආ) මෙම දිස්ත්‍රික්කයේ පවත්නා ඇබෑර්තු සම්බන්ධයෙන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන මුළු අපේක්ෂකයින්ගේ සංඛ්‍යාව 150ක් වනු ඇත.

(iv) අපේක්ෂකයන් විසින් පහත 10 (iii) වැනි ඡේදයේ සඳහන් සහතිකවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතු ය.

(v) ඉහත දක්වා ඇති මිණුම් දණ්ඩ යටතේ සුදුසුකම් නො ලබන අපේක්ෂකයන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු නොලැබේ. අපේක්ෂකයෙකු සම්මුඛ පරීක්ෂණයට කැඳවනු නොලබනුයේ ඔහු සුදුසුකම් නොලබා ඇති නිසාය."

මෙම සංශෝධනයන්ට අනුකූලව ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනය 1970 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා දීර්ඝ කරන ලදී. දැනටමත් ඉල්ලුම්පත්‍ර එවා ඇති අයදුම්කරුවන් නැවත ඉල්ලුම්පත් එවීම අවශ්‍ය නොවේ.

පී. ඇම්. විජේකෝන්,
නුවරඑළියේ දිසාපති.

1970.12.10 දින,
නුවරඑළියේ,
දිසාපති කායබීලයේදීය.

12-911—70.12.24 දින අංක 14,938 දරන ගැසට් පත්‍රය

---

## හම්බන්තොට දිස්ත්‍රික්කය

### ග්‍රාමසේවක සේවයට බඳවා ගැනීම

ග්‍රාමසේවක සේවයට බඳවා ගැනීම සම්බන්ධයෙන්, අංක 14,932 හා 1970 නොවැම්බර් මස 12 වැනි දිනැති ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවී ඇති නිවේදනය වෙත අවධානය යොමු කරවනු ලැබේ.

එම නිවේදනයේ 4 වැනි ඡේදයේ (iv) අනුඡේදය, (vi) අනුඡේදය සහ 7 වැනි ඡේදය පහත සඳහන් අයුරින් සංශෝධනය කරමි :—

4. **සුදුසුකම්.**—(iv) අපේක්ෂකයන්ට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුය :—

(ඒ) සිංහල හෝ දෙමළ භාෂාව සහ අංක ගණිතය හෝ ගණිතය යන විෂයයන්ගෙන් සාමාර්ථයන් ද ඇතුළුව අඩුතරමින් විෂයයන් දෙකකින් සම්මාන සාමාර්ථ සහිත ලංකා ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය ; හෝ

(බී) සිංහල හෝ දෙමළ භාෂාව සහ අංක ගණිතය හෝ වාණිජ අංක ගණිතය හෝ මූලික ගණිතය හෝ ශුද්ධ ගණිතය යන විෂයයන්ගෙන් සාමාර්ථයන් ද ඇතුළුව අඩුතරමින් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් හයකින්, දෙවරකට නොවැඩි වාර ගණනකදී ලබාගත් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) සහතිකය ; හෝ

(සී) විෂයයන් හතරක් සහිත අධ්‍යයන පොදු සහතික පත්‍රය (උසස් පෙළ) හෝ උපාධියක් වැනි උසස් සුදුසුකම්.

**සටහන.**—සිංහල කථාකරන මෙම ග්‍රාමසේවක කොට්ඨාශවල ග්‍රාම සේවක තනතුරු සඳහා ඉදිරිපත් වන අපේක්ෂකයන් සිංහල භාෂාව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දි හෝ සමත් වී සිටිය යුතුය.

(vi) (ඒ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පූර්ව කිට්ටුම වර්ෂ හයක කාලසීමාව ඇතුළත අපේක්ෂකයාට මෙම දිස්ත්‍රික්කය තුළ අඩුතරමින් වර්ෂ තුනක්වත් අඛණ්ඩ ස්ථිර පදිංචියක් තිබිය යුතුය. මෙයට සාක්ෂි වශයෙන් ග්‍රාමසේවකගෙන් ලබාගත් පදිංචිය පිළිබඳ සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. ගෘහමූලික ලැයිස්තු, මැතිවරණ ඡන්දදායක ලැයිස්තු වැනි ලියවිලි ද මේ සඳහා ඉදිරිපත් කළ හැකිය ; නැතහොත්

(බී) අපේක්ෂකයා මෙම දිස්ත්‍රික්කය තුළ උපන් අයෙකු විය යුතුය. ඒ සඳහා තම අයිතිය තහවුරු කිරීම පිණිස ඔහුගේ උප්පැන්න සහතිකය ඉදිරිපත් කළ යුතුය ; නැතහොත්

(සී) මෙම දිස්ත්‍රික්කය තුළ පිළිවෙළින් අවුරුදු පහකට නො අඩු කාලසීමාවක් ස්වකීය ඉගෙනීම කර තිබිය යුතුය. මෙම අයිතිය තහවුරු කිරීම පිණිස විදුහල්පතිතුමාගෙන් ලබාගත් පාඨශාලා සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

**සටහන.**—දෙමව්පියන් කලින් කල මාරුවීයාම හේතුකොටගෙන පදිංචිය පිළිබඳ සුදුසුකම් සනාථ කිරීමට අපොහොසත් වන මාරුවීම් සහිත සේවාවල නියුක්ත නිලධාරීන්ගේ දරුවන් අපේක්ෂකයන් ලෙස ඉදිරිපත්වූ විට එම අපේක්ෂකයාගේ ස්ථිර පදිංචි ස්ථානය ලෙස මවගේ හෝ පියාගේ උපන් ස්ථානය සැලකිය හැක.

7. **සම්මුඛ පරීක්ෂණය.**—(i) ලකුණු 100 ක් වෙන් කෙරෙන සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වෙනු ඇත. මෙම සම්මුඛ පරීක්ෂණයේදී අපේක්ෂකයාගේ පෙනුම, පෞරුෂත්වය, නායකත්වය පිළිබඳ ගුණාංග, චරිතය, කීර්තිය සහ බුද්ධියත්, සාමාන්‍ය වශයෙන් පළාතේ තොරතුරු පිළිබඳව අපේක්ෂකයාගේ දැනුමත් සැලකිල්ලට ගෙන ලකුණු වෙන් කෙරෙනු ඇත.

ගමට සහ ගමේ සුභ සාධනයට අදාළ කරුණු පිළිබඳව අපේක්ෂකයාගේ දැනුම නිශ්චය කිරීම සඳහා ප්‍රශ්න අසනු ඇත.

(ii) ලකුණු ප්‍රමාණ කිරීමේ ක්‍රමය යටතේ කුසලතා අනුව වැඩිම මුළු ලකුණු සංඛ්‍යාවක් ලබාගත් අපේක්ෂකයන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා යොදවනු ලැබේ.

(iii) පහත (අ) සහ (ආ) ඡේදයන් යටතේ සුදුසුකම් ලබන අපේක්ෂකයන් සංඛ්‍යාවෙන් වැඩි කවර සංඛ්‍යාවක් හෝ අනුව සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අපේක්ෂකයන්ගේ සංඛ්‍යාව නිශ්චය කෙරෙනු ඇත :—

(අ) සම්මුඛ පරීක්ෂණය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණයෙන් (100න්) ලබාගන්නා, උපරිම ලකුණු සංඛ්‍යාව සහ ලකුණු ප්‍රමාණ කිරීමේ ක්‍රමය අනුව ලබාගන්නා ලකුණු සංඛ්‍යාවද එක්ව ගත් කළ පත්වීමක් සඳහා සලකා බැලීමට ප්‍රමාණවත් ලකුණු සංඛ්‍යාවක් ලබාගෙන නැති අපේක්ෂකයන් කිසිවෙක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබීමට සුදුස්සන් නොවනු ඇත.

**නිදර්ශනයක්.**—ඇබෑර්තු 10 ක් තිබේනම් සහ ලකුණු ප්‍රමාණ කිරීමේ ක්‍රමය යටතේ කුසලතා අනුව දහවැනියා ලබා ඇති මුළු ලකුණු ප්‍රමාණය 340 නම් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබීමට සුදුස්සන් වීම පිණිස අපේක්ෂකයින් විසින් ලකුණු ප්‍රමාණ කිරීමේ ක්‍රමය යටතේ අඩු වශයෙන් ලකුණු 240 ක් වත් ලබාගත යුතුය.

(ආ) මෙම දිස්ත්‍රික්කයේ පවත්නා ඇබෑර්තු සම්බන්ධයෙන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන මුළු අපේක්ෂකයින්ගේ සංඛ්‍යාව පහත ගෙනහැර දක්වා ඇති ඇබෑර්තු සංඛ්‍යාවේ ගුණිතයට නොඅඩු සංඛ්‍යාවක් වනු ඇත :—

| ඇබෑර්තු සංඛ්‍යාව | සම්මුඛ පරීක්ෂණයට කැඳවිය යුතු සංඛ්‍යාව |
|---|---|
| 5 හෝ ඊට අඩු | ... 75 |
| 6 සිට 10 දක්වා | ... 120 |
| 11 සිට 15 දක්වා | ... 150 |
| 16 සිට 20 දක්වා | ... 160 |
| 21 සිට 25 දක්වා | ... 175 |
| 26 සිට 30 දක්වා | ... 180 |
| 31 සිට 35 දක්වා | ... 185 |

(iv) අපේක්ෂකයන් විසින් පහත 10 (iii) වැනි ඡේදයේ සඳහන් සහතිකවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

(v) ඉහත දක්වා ඇති මිණුම් දණ්ඩ යටතේ සුදුසුකම් නො ලබන අපේක්ෂකයන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු නොලැබේ. අපේක්ෂකයකු සම්මුඛ පරීක්ෂණයට කැඳවනු නොලබනුයේ ඔහු සුදුසුකම් නොලබා ඇති නිසාය.

මේ අනුව, ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනය 1971.1.15 වැනි දින දක්වා දීර්ඝ කර ඇත.

සෙ. වී. ගුණවර්ධන,
හම්බන්තොට දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1970 දෙසැම්බර් මස 9 වැනි දින,
හම්බන්තොට කච්චේරියේදීය.

12-954—70.12.24 දින අංක 14,938 දරන ගැසට් පත්‍රය

## ග්‍රාම සේවක සේවයට බඳවා ගැනීම

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ග්‍රාම සේවක සේවයේ ඇබෑර්තු පිරවීම සඳහා 1970. 11.12 දින අංක 14,932 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනයේ 4, 5, 6, හා 7 දරණ ඡේදයන් පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

**සුදුසුකම්.**—(iv) අනුඡේදය සම්පූර්ණයෙන්ම අස්කර මෙසේ යෙදිය යුතුය.

(iv) අපේක්ෂකයන්ට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුය :—

(ඒ) සිංහල හෝ දෙමළ භාෂාව සහ අංක ගණිතය හෝ ගණිතය යන විෂයයන්ගෙන් සාමාර්ථයන්ද ඇතුලුව අඩු තරමින් විෂයයන් දෙකකින් සම්මත සාමාර්ථ සහිත ලංකා ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය ; හෝ

(බී) සිංහල හෝ දෙමළ භාෂාව සහ අංක ගණිතය හෝ වාණිජ අංකගණිතය හෝ මූලිකගණිතය හෝ සුද්ධගණිතය යන විෂයයන්ගෙන් සාමාර්ථයන්ද ඇතුලුව අඩු තරමින් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් හයකින්, දෙවරකට නොවැඩි වාර ගනනකදී ලබාගත් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙල) සහතිකය ; හෝ

(සී) **විෂයයන්** හතරක් සහිත අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) හෝ උපාධියක් වැනි උසස් සුදුසුකම්.

**සටහන.**—සිංහල කථාකරණ ග්‍රාම සේවක කොට්ඨාශවල ග්‍රාම සේවක තනතුරු සඳහා ඉදිරිපත් වන අපේක්ෂකයන් සිංහල භාෂාවද, දෙමළ කථා කරණ ග්‍රාම සේවක කොට්ඨාශවල ග්‍රාම සේවක තනතුරු සඳහා ඉදිරිපත් වන අපේක්ෂකයන් දෙමළ භාෂාවද, ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේදී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී හෝ සමත් වී සිටිය යුතුය.

(v) 1971. 1.31 දිනට අපේක්ෂකයන් වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතු අතර වයස අවුරුදු 35 ට වැඩි නොවිය යුතුය. රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරු දරණ අයට උපරිම වයස් සීමාව බලපාන්නේ නැත.

(vi) **අනුඡේදය.**—මෙය සම්පූර්ණයෙන් ඉවත් කර මෙසේ යෙදිය යුතුය.

(vi) (අ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පූර්ව කිට්ටුම වර්ෂ හයක කාලසීමාව ඇතුළත අපේක්ෂකයාට තමා පත්වීම බලාපොරොත්තු වන පාලන දිස්ත්‍රික්කය තුල අඩු තරමින් වර්ෂ තුනක්වත් අඛණ්ඩව ස්ථිර පදිංචියක් තිබිය යුතුය. මෙයට සාක්ෂි වශයෙන් ග්‍රාම සේවකගෙන් ලබාගත් පදිංචිය පිළිබඳ සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. ගෘහ මූලික ලැයිස්තු, මැතිවරණ ඡන්දදායක ලැයිස්තු වැනි ලියවිලි ද මේ සඳහා ඉදිරිපත් කළ හැකිය ; නැත හොත්,

(ආ) අපේක්ෂකයා පුරප්පාඩු ඇති වන පාලන දිස්ත්‍රික්කය තුළ උපන් අයෙකු විය යුතුය ඒ සඳහා තම අයිතිය තහවුරු කිරීම පිණිස ඔහුගේ උප්පැන්න සහතිකය ඉදිරිපත් කළ යුතුය, නැතහොත්

(ඇ) පුරප්පාඩු ඇති වන පාලන දිස්ත්‍රික්කය තුළ පිළිවෙලින් අවුරුදු පහකට නොඅඩු කාලසීමාවක් සවකීය ඉගෙනීම කර තිබිය යුතුය. මෙම අයිතිය තහවුරු කිරීම පිණිස විදුහල්පති තුමාගෙන් ලබා ගත් පාඨශාලා සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

**සටහන.**—දෙමවුපියන් කලින් කල මාරුවීයාම හේතුකොටගෙන පදිංචිය පිළිබඳ සුදුසුකම් සනාථ කිරීමට අපොහොසත්ව වන මාරුවීම් සහිත සේවාවල නියුක්ත නිළධාරීන්ගේ දරුවන් අපේක්ෂකයින් ලෙස ඉදිරිපත් වූ විට එම අපේක්ෂකයාගේ ස්ථිර පදිංචි ස්ථානය ලෙස මවගේ හෝ පියාගේ උපන් ස්ථානය සැලකිය හැක.

7. **සම්මුඛ පරීක්ෂණය.**—මෙම ඡේදය සම්පූර්ණයෙන්ම අස්කර මෙසේ යෙදිය යුතුය.

7. සම්මුඛ පරීක්ෂණය—

(i) ලකුණු 100 ක් වෙන්කෙරෙන සම්මුඛ පරීක්ෂණයක් පැවැත් වෙනු ඇත. මෙම සම්මුඛ පරීක්ෂණයේදී අපේක්ෂකයාගේ පෙනුම, පෞරුෂත්වය, නායකත්වය පිළිබඳ ගුණාංග, චරිතය, කීර්තිය සහ බුද්ධියත්, සාමාන්‍ය වශයෙන් පළාතේ තොරතුරු පිළිබඳව අපේක්ෂකයාගේ දැනුමත් සැලකිල්ලට ගෙන ලකුණු වෙන් කෙරෙනු ඇත.

ගමට සහ ගමේ සුභසාධනයට ආදාළ කරුණු පිළිබඳව අපේක්ෂකයාගේ දැනුම නිශ්චය කිරීම සඳහා ප්‍රශ්ණ අසනු ඇත.

(ii) ලකුණු ප්‍රමාණ කිරීමේ ක්‍රමය යටතේ කුසලතා අනුව වැඩිම මුලු ලකුණු සංඛ්‍යාවක් ලබාගත් අපේක්ෂකයන් පමණක් එක් එක් පාලන දිස්ත්‍රික්කයෙන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

(iii) පහත (අ) සහ (ආ) ඡේදයන් යටතේ සුදුසුකම් ලබන අපේක්ෂකයන් සංඛ්‍යාවෙන් වැඩි කවර සංඛ්‍යාවක් හෝ අනුව සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අපේක්ෂකයන් ගේ සංඛ්‍යාව නිශ්චය කෙරෙනු ඇත.

(අ) සම්මුඛ පරීක්ෂණය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණ යෙන් (100) න් ලබාගන්නා, උපරිම ලකුණු සංඛ්‍යාව සහ ලකුණු ප්‍රමාණ කිරීමේ ක්‍රමය අනුව ලබා ගන්නා ලකුණු සංඛ්‍යාවද එක්ව ගත් කල පත්වීමක් සඳහා සලකා බැලීමට ප්‍රමාණවත් ලකුණු සංඛ්‍යාවක් ලබා ගෙන නැති අපේක්ෂකයන් කිසිවෙක් සම්මුඛ පරීක්ෂයනට කැඳවනු ලැබීමට සුදුස්සන් නොවෙනු ඇත.

**නිදර්ශනයක්.**—ඇබෑර්තු 10 ක් තිබේ නම් සහ ලකුණු ප්‍රමාණ කිරීමේ ක්‍රමය යටතේ කුශලතා අනුව 10 වැනියා ලබා ඇති මුලු ලකුණු ප්‍රමාණය 340 නම් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබීමට සුදුස්සන් වීම පිණිස අපේක්ෂකයන් විසින් ලකුණු ප්‍රමාණ කිරීමේ ක්‍රමය යටතේ අඩු වශයෙන් ලකුණු 240 ක් වත් ලබා ගත යුතුය.

(ආ) එක් එක් පාලන දිස්ත්‍රික්කයේ පවත්නා ඇබෑර්තු සම්බන්ධ යෙන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන මුලු අපේක්ෂයින්ගේ සංඛ්‍යාව පහත ගෙන හැර දක්වා ඇති ඇබෑර්තු සංඛ්‍යාවේ ගුණිතයකට නොඅඩු සංඛ්‍යාවක් වනු ඇත.

| ඇබෑර්තු සංඛ්‍යාව | | සම්මුඛ පරීක්ෂණයට කැඳවිය යුතු සංඛ්‍යාව |
|---|---|---|
| 5 හෝ ඊට අඩු | ... | 75 |
| 6 සිට 10 දක්වා | ... | 120 |
| 11 සිට 15 දක්වා | ... | 150 |
| 16 සිට 20 දක්වා | ... | 160 |
| 21 සිට 25 දක්වා | ... | 175 |
| 26 සිට 30 දක්වා | ... | 180 |
| 31 සිට 35 දක්වා | ... | 185 |

(iv) අපේක්ෂකයන් විසින් පහත 10 (iii) වැනි ඡේදයේ සඳහන් සහතිකවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කල යුතුය.

(v) ඉහත දක්වා ඇති මිනුම් දණ්ඩ යටතේ සුදුසුකම් නොලබන අපේක්ෂකයන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු නොලැබේ. අපේක්ෂකයකු සම්මුඛ පරීක්ෂණයට කැඳවනු නොලබනුයේ ඔහු සුදුසුකම් නොලබා ඇති නිසාය.

අයදුම්පත් බාර ගන්නා අවසාන දිනය 1971. 1. 31 දක්වා දීර්ඝ කර ඇත.

කේ. බී. සූරියගොඩ,
පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1970 දෙසැම්බර් 14 දින,
පොළොන්නරුව කච්චේරියේ දීය.

12-963—70.12.24 දින අංක 14,938 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන අමාත්‍යාංශය

### දිස්ත්‍රික්ක සේවා ක්‍රමය යටතේ සහතික පත්‍ර නොලත් ගුරුවරුන් බඳවා ගැනීම

රජයේ පාඨශාලාවල සහතික පත්‍ර නොලත් උපගුරු තනතුරු සඳහා **ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර** හෝ ඊට සමාන සුදුසුකම් ලත් අයදුම් කරුවන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවමින්, 1970 අගෝස්තු 28 වැනි දින අංක 14,921 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනයේ 5 (බී) ඡේදය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු **ලැබේ.**

"1970. 9. 18 දිනට වයස අවුරුදු 18 ට අඩු නොවිය යුතු අතර, 1971. 1. 1 දිනට වයස අවුරුදු 30 ට වැඩි නොවිය යුතුය."

මෙම සංශෝධිත නිවේදනයට අනුකූල නොවන අයදුම් පත් ගැන සලකා බලනු නොලැබේ.

පී. උඩගම,
ස්ථිර ලේකම්.

1970 දෙසැම්බර් මස 17 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
මැලේ වීදිය, කොළඹ 2.

12-919—70.12.24 දින අංක 14,938 දරන ගැසට් පත්‍රය

## ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ තෝප්පූර කොට්ඨාශය

### උප්පැන්න සහ මරණ ලේකම් ධුරය

ඉහත සඳහන් ධුරය සඳහා තෝප්පූර, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුල ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතු කොට ගෙන පලාත්වාසීන්ගෙන් සැලකුම් ලබන ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනට අයදුම් කරුවන් වයස අවුරුදු විසිඑකට නොඅඩු විය යුතුය. රජයේ සේවයේ නියුතු අයදුම් කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපණික හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියලු විස්තර මෙම කායසීලයේ හා ප්‍රාදේශීය ආදායම් නිලධාරී කායසීල, ග්‍රාමසේවක කායසීලය, ග්‍රාමීය උසාවි, තැපැල් කායසීල, පොලිස් ස්ථාන, ප්‍රජාමන්ඩල, ප්‍රසිද්ධ වෙලඳ පොලවල් සහ සමුපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කායසීලවල ප්‍රදර්ශණය කර ඇති දැන්වීම් වල ඇතුලත් වේ.

3. සියලුම ඉල්ලුම්පත් මෙම කායසීලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල සකස්විය යුතු අතර, ඒවා 1971 ජනවාරි 30 වෙනි දිනට හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

ඩබ්ලිව්. ලයනල් ප්‍රනාන්දු,
දිස්ත්‍රික් ලේකම්.

1970 දෙසැම්බර් මස 10 වැනි දින,
ත්‍රිකුණාමලේ,
දිස්ත්‍රික් ලේකම් කායසීලයේ දීය.

12–877—70.12.24 දින අංක 14,938 දරන ගැසට් පත්‍රය

---

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## කොළඹ වරාය කොමිෂන් සභාව

### කිරිහලක් පවත්වාගෙන යෑමට "මැරින් ඩ්‍රයිව්" හි පිහිටි ව. කො. සභාව සතු ඉඩම් කැබැල්ල

වරාය කොමසාරිස් විසින් නියම කරනු ලබන දිනක සිට අවුරුද්දක කාලසීමාවකට යථෝක්ත ඉඩම් කැබැල්ල බදුදීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් 1971.1.14 වැනි දින පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ.

2. වරාය කොමිෂන් සභා කාර්යාලයෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මවල පිළියෙල කරන ලද ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුක්තව එවිය යුතුය. මෙම පෝර්ම ලබාගත හැකි වන්නේ වාරය කොමිසන් සභාව වෙත රු. 100 ක් තැන්පත් කිරීමෙන් පසුවය.

3. 1971.1.12 වැනි දින පස්වරු 2.30 වනතුරු කාර්යාලයේ වැඩ කරන වේලාවල ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

4. බද්ද පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පෝර්ම සමග නිකුත් කරනු ඇත.

12–899—70.12.24 දින අංක 14,938 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනා ගමන මණ්ඩලය

රියදුරු අසුන් (යන්ත්‍රාවලිය......... විඩ්නි කොරලයිට් ගේ ආදර්ශ සටහන 40707 අනුව හෝ ඊට සමාන) නිෂ්පාදනය කර සැපයීම සඳහා කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලයේ ටෙන්ඩර් මණ්ඩලීය සභාපති තැන විසින් 1971 ජනවාරි 15 වෙනි දින පෙ. ව. 10 දක්වා දේශීය නිෂ්පාදකයන්ගෙන් ටෙන්ඩර් පත්‍රිකා භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍රිකා භාරගනු ලබන අවසාන දිනයට පෙරදින දවල් 12 දක්වා මගේ කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල පිළියෙල කළ ටෙන්ඩර් පත් අනුපිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 බොරලැස්ගමුවේ වේරහැර ලංගම ප්‍රධාන ගිණුම් නිලධාරි තැන වෙත මුදලින් ඉදිරිපත් කර ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සිය ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීම පිණිස මගේ කාර්යාලයට ඉදිරිපත් කළ යුතුය.

වැඩි විස්තර මගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

ලංකා ගමනා ගමන මණ්ඩලයේ,
ප්‍රධාන සම්පාදක නිලධාරී තැන.

සම්පාදක කොට්ඨාශය,
වේරහැර,
බොරලැස්ගමුව.

12–948—70.12.24 දින අංක 14,938 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### පූනකරි නි.මි.යෝ.ක්‍රි. ගබඩාවේ කම්කරු හා ප්‍රවාහන සේවා—1971

පූනකරි නි.මි.යෝ.ක්‍රි. ගබඩාවේ 1971 වර්ෂයේ කම්කරු හා ප්‍රවාහන සේවාවන් සඳහා 1971.1.12 දින දහවල් 10 දක්වා යාපනයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් විසින් මිළ ගණන් භාරගනු ලැබේ.

මෙම කාර්යය සඳහා 1971.1.12 වෙනි දින 10 දක්වා යාපනයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් විසින් නිකුත් කරනු ලබන මිළ ගණන් පෝර්ම, මිළ ගණන් කරුවන් විසින් සම්පූර්ණ කොට පිටපත් දෙකකින් යුතුව, යාපනයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතුය.

1971.1.12 වෙනි දින පෙරවරු 10 ට පෙර යාපනයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් වෙත ලිපි කවරයේ "1971 වර්ෂයේ පූනකරි නි.මි.යෝ.ක්‍රි. ගබඩාවේ කම්කරු හා ප්‍රවාහන සේවා සඳහා මිළ ගණන්" යනුවෙන් සඳහන් කර ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ යාපනයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තු කාර්යාලයේ තබා ඇති මිළ ගණන් පෙට්ටියට මිළ ගණන් පත් දැමීමට හෝ පුළුවන. නියමිත දිනයේ නියමිත වේලාවට පසුව ලැබෙන මිළ ගණන් පත් ගැන සලකා බලනු නොලැබේ.

1971.1.12 වෙනි දින පෙරවරු දහවල් 11 ට මිළ ගණන් පත් විවෘත කරන වේලාවේදී සියළුම මිළ ගණන් ඉල්ලුම්කරුවන්ට පැමිණීමට ඉඩ දෙනු ලැබේ.

කේ. සබාරත්නම්,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්.

1970 දෙසැම්බර් මස 16 වැනි දින,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, යාපනය.

12–922—70.12.24 දින අංක 14,938 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඉප/260 (70/71)

## ගාලු කච්චේරිය—ටෙන්ඩර් කැඳවීම පිළිබඳ දැන්වීමයි

ගාලු දිස්ත්‍රික්කයේ පහත උප ලේඛනයේ සඳහන් තැනීම් වැඩ සඳහා 1971 ජනවාරි මස 20 වැනි බදාදා ප. ව. 2.30 වන තෙක් ගාල්ලේ දිසාපති විසින් ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ. එම ටෙන්ඩර් පත් විවෘත කරන අවස්ථාවේ දී ටෙන්ඩර් කරුවන්ට එම කාර්යාලයට පැමිණ සිටිය හැකිය. ටෙන්ඩර් තැන්පත් කරන පෙට්ටිය ගාලු දිසාපති කාර්යාලයේ උප දිසාපතිගේ කායසීල කාමරයේ තබනු ඇත. එක් එක් වැඩය වෙනුවෙන් වෙන වෙනම ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතු වේ.

2. ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුත්තේ ගාල්ලේ දිසාපති වෙතින් ලබාගත යුතු වන ආකෘති පත්‍ර මගින් පිටපත් දෙකකින් යුක්තවයි. මෙම වැඩ පිළිබඳ සැලසුම් පූර්වෝක්ත දිසාපති කාර්යාලයේ දී බැලිය හැකි වන අතර, ඒ පිළිබඳ සියලු විස්තර ඔහු වෙතින් ලබාගත හැක.

3. රජයේ වැඩ වාරිමාර්ග හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුවල පහත සඳහන් ඒ ඒ වැඩවලට ඉදිරියෙන් දක්වා ඇති මුදලට හෝ ඊට වැඩියෙන් ලියාපදිංචි වී ඇති, මෙවැනි වැඩ හොඳින් කිරීමට හැකියාවක් තිබෙන සමුපකාර හා ග්‍රාම සංවර්ධන සමිතිවලට සහ එසේ ලියාපදිංචි පුද්ගලික කොන්ත්‍රාත් කරුවන් වද මෙම වැඩ සඳහා ඉල්ලුම් කළ හැකි අතර, ඒ වෙනුවෙන් ඉහත සඳහන් දිසාපති වෙත එසේ ලියා පදිංචි වී තිබීම හා හැකියාව පිළිබඳ සාධකත්, රු. 100 ක

ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා වූ කුවිතාන්සියත් ඉදිරිපත් කළ යුතු වන්නේය. ටෙන්ඩර් පත් නිකුත් කරනු ලබන අවසාන දිනය 1971 ජනවාරි මස 17 වැනිද ප. ව. 3.00 දක්වා වන්නේය. ලියාපදිංචි සමිති විසින් ටෙන්ඩර් තැන්පත් තැබීම අවශ්‍ය නොවේ. එහෙත් ඒ ඒ සමිතිවලට අදාල දෙපාර්තමේන්තුවල දිස්ත්‍රික්ක ප්‍රධානීන්ගෙන් ලබාගත් තමන්ගේ හැකියාවන් පිළිබඳ සහතික මා වෙත ඉදිරිපත් කළ යුතු වන්නේය.

4. මෙම ටෙන්ඩර් තැන්පත් මුදල ගාල්ලේ දිසාපති කාර්යාලයේ හෝ ගාල්ලෙන් පිටත ඕනෑම දිසාපති කාර්යාලයකදී හෝ කොළඹ මුදල් භාණ්ඩාගාරයේදී හෝ ගෙවීමට පිළිවන.

5. ටෙන්ඩර් බහාලන ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙලවරේ ''.......................................................................................සඳහා ටෙන්ඩර් පත්‍රය '' යනුවෙන් සඳහන් විය යුතු අතර, සියලුම ටෙන්ඩර් පත්‍ර අත්සන් තබා සීල්කර, සුරක්ෂිතව ඉදිරිපත් කළයුතුයි.

1970.12.4 දින,
ගාල්ලේ දිසාපති කාර්යාලයේ දිය.

ඩබ්ලිව්. එල්. ආර්. බී. ද අල්විස්,
උප දිසාපති,
ගාල්ලේ දිසාපති වෙනුවට.

## උපලේඛනය

| | වැඩ විස්තරය | පිහිටි ප්‍රදේශය | ලියාපදිංචි වී තිබිය යුතු මුදල |
|---|---|---|---|
| | | | රු. |
| 1. | උඩුමලගල ජනපද පාර 3 වැනි සැතපුම තැනීම ... | තල්පෙ පත්තුව ... | 15,000 |
| 2. | මාගෙදර උඩුවැල්ල–නිමලව පාර 2 වැනි සැතපුම ඉතිරි වැඩ | එම ... | 10,000 |
| 3. | බටුවන්ගල ජනපද නිලධාරි නිවස අළුත්වැඩියාව ... | හිනිදුම් පත්තුව ... | 10,000 |
| 4. | රත්මැහැර වත්ත පොදු ලිං 2 ක් තැනීම ... | ගහබඩපත්තු (ද) ... | 10,000 |
| 5. | දිවිතුර වත්ත පොදු ලිං 2 ක් තැනීම ... ... | එම ... | 10,000 |
| 6. | රජමුකලාන ජනපදයේ පොදු ලිං 2 ක් තැනීම ... | කඩවත් සතර ... | 10,000 |
| 7. | ලංසියාහේන ජනපදයේ පොදු ළිඳක් තැනීම ... | එම ... | 5,000 |
| 8. | බන්දුගොඩ ජනපදයේ පොදු ළිඳක් තැනීම ... | එම ... | 5,000 |
| 9. | අංකොක්කාවල ජනපදයේ පොදු ළිං 2 ක් තැනීම ... | එම ... | 10,000 |
| 10. | ගලගොඩ ජනපදයේ පොදු ලිං 1 ක් තැනීම ... | වැල්ලබඩ පත්තුව ... | 5,000 |
| 11. | කැරන්විල ජනපදයේ පොදු ළිඳක් තැනීම ... | කඩවත් සතර ... | 5,000 |
| 12. | ඇටවලවත්තේ පොදු ලිං 2 ක් තැනීම ... ... | බෙ. ව කෝ. (බටහිර) ... | 10,000 |
| 13. | දංවලවත්ත පාර තැනීම ... ... | තල්පෙ පත්තුව ... | 10,000 |

12–890—70.12.24 දින අංක 14,938 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

පදංගල වන්ද්‍රිකා වැව, ඉඩම් සංවර්ධන නිලධාරි තැන විසින් 1971 ජනවාරි මස 15 වන දින පස්වරු 3.00 දක්වා, හඳපාන්ගල ලී මෝලෙහි ඇති, පහත සඳහන් කඳන් මිළයට ගැනීම හා ගෙනයාම සඳහා ටෙන්ඩර් පත් ලාංකික ටෙන්ඩර් කරුවන්ගෙන් පමණක් භාරගනු ලැබේ.

| වර්ගය | දිග | මැදවටය | ඝන අඩි ප්‍රමාණය |
|---|---|---|---|
| මී | ... 21′– 0″ | ... 6′–6″ ... | 55.5 |
| මී | ... 18′–10″ | ... 5′–4″ ... | 33.8 |
| මී | ... 17′– 6″ | ... 7′–6″ ... | 63.3 |
| මී | ... 21′– 0″ | ... 6′–8″ ... | 58.3 |

ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට පෙර මුදලින් රු. 50.00 ක් මෙම කාර්යාලයේ හෝ ලඟම ඇති දිසාපති කාර්යාලයේ හෝ තැන්පත් කොට ලබාගත් පො. ආ. 176 දරණ රිසිට් පතක් ඉදිරිපත් කළ යුතුය. 1971 ජනවාරි මස 15 දින පෙ.ව. 10.30 දක්වා ටෙන්ඩර් පෝර්ම මෙම කාර්යාලයෙන් ලබාගත හැකිය.

මෙම කාර්යාලයෙන් ලබාගත් පෝර්මවල පමණක් ඉදිරිපත් කලයුතු ටෙන්ඩර් පත් 1971 ජනවාරි 15 දින ප.ව. 3.00 ට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ මෙම කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමට ක්‍රියාකළ යුතුය. සුරක්ෂිතව සීල් තබන ලද ලියුම් කවරයක බහාලන ලද ටෙන්ඩර් පත්, වන්ද්‍රිකා වැව, ඉඩම් සංවර්ධන නිලධාරී නමට එවිය යුතුය. ලියුම් කවරයේ වම් පස මුදුන් කෙළවරේ '' කඳන් මිලට ගැනීම හා ගෙන යාමට ටෙන්ඩර් '' යනුවෙන් සඳහන් කළ යුතුය.

1971 ජනවාරි මස 15 වන දින ප. ව. 3.30 ට ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේදී විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් කරුවන්ට ද එම අවස්ථාවේ පැමිණ සිටිය හැක.

සාර්ථක ටෙන්ඩර් කරු විසින් ඒ බව දැනුම් දීමෙන් සතියක් ඇතුලත මෙම කාර්යාලයේ මුදල් තැන්පත් කොට, හඳපාන්ගල ලීමෝලේ ගබඩා පාලක වෙතින් ඉහත සඳහන් කොට ඇති කඳන් ගෙනයාමට ක්‍රියාකළ යුතුය.

මෙම කඳන් 1971 ජනවාරි මස 5 දින සිට 1971 ජනවාරි මස 14 වැනි දින දක්වා වැල්ලවාය, හඳපාන්ගල ලීමෝලේදී බලාගත හැක.

ජේ. පරනමාන,
ඉඩම් සංවර්ධන නිලධාරී,
වන්ද්‍රිකාවැව.

1970 දෙසැම්බර් මස 9 දින,
වන්ද්‍රිකාවැව, ඉඩම් සංවර්ධන කාර්යාලයේ දීය.

12–889—70.12.24 දින අංක 14,938 දරන ගැසට් පත්‍රය

---

## තැපැල් සහ විදුලිය සංදේශ දෙපාර්තමේන්තුව

### යාපනයේ පරණ තැපල් කාර්යාල ගොඩනැගිල්ල බිඳහෙලීම

පූර්වෝක්ත ගොඩනැගිල්ල බිඳ හෙළා, එම ස්ථානයෙන් සුන්බුන් ඉවත් කරලීම සඳහා, කොළඹ 1, තැපැල් සහ විදුලිය සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ලේ පිහිටි අතිරේක ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ තැපැල් සහ විදුලිය සංදේශ දෙපාර්තමේන්තුවේ හෝ ලියා පදිංචි කෙරුණු කොන්ත්‍රාත් කරුවන්ගෙන් වර්ෂ 1971 ජනවාරි මස 12 වැනි දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

2. 1971 ජනවාරි 12 දින පෙ. ව. 10.30 ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලබන අතර, ටෙන්ඩර් කරුවන් කැමති නම් ටෙන්ඩර් විවෘත කරන විට ඔවුන්ට පැමිණ සිටිය හැකිය.

3. කොළඹ 5, නාරාහේන්පිට පිහිටි උපකරණ, ගොඩනැගිලි, ශුභ සාධක හා ගබඩා සහකාර අධිකාරි කාර්යාලයෙන් හෝ යාපනය (උතුර) ප්‍රාදේශීය තැපැල් අධිකාරි කාර්යාලයෙන් හෝ ලබාගත හැකිවන පෝර්මවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

4. කොළඹ 1, ප්‍ර.තැ.කා. හි '' පැමිණ ලියුම් ලබාගන්නා '' කවුන්ටරයෙහි (අංක 4) හෝ යාපනය තැපැල් කාර්යාලයෙහි හෝ තැන්පත් කළ යුතු රු. 50ක ටෙන්ඩර් තැන්පතුවක් වෙනුවෙන් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පසුව 1971 ජනවාරි 2 වැනි දින ප. ව. 4.30 දක්වා ටෙන්ඩර් පෝර්ම නිකුත් කෙරෙනු ඇත.

සී. ජේ. සේරසිංහ,
වැඩ බලන පෝස්මාස්ටර ජනරාල් සහ
විදුලිය සංදේශ අධ්‍යක්ෂ.

තැ. හා වි. සං. මූලස්ථානය,
කොළඹ 1.

12–888—70.12.24 දින අංක 14,938 දරන ගැසට් පත්‍රය

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

දුම්රිය දෙපාර්තමේන්තුවට සිලිං විදුලි පංකා 150 ක් සැපයීම සඳහා දේශීය නිෂ්පාදකයින්ගෙන් සහ සැපයුම් කරුවන්ගෙන් ටෙන්ඩර් පත්‍ර, දුම්රිය මූලස්ථාන ටෙන්ඩර් මණ්ඩල සභාපති විසින් (ලිපිනය : දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්‍යාලය, තැ. පෙ. 355, කොළඹ 10), 1971 ජනවාරි මස 24 වෙනි ඉරිදා පෙ. ව. 11 වන තෙක් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පළමු ටෙන්ඩර්කරුවන් විසින් ඉහත සඳහන් සේවාව භාරගැනීමට සහ හරියාකාර ඉටුකිරීමට තමාගේ මූදල් තත්වය ප්‍රමාණවත් බව, අවශ්‍ය වුවහොත් ඔප්පු කිරීම පිණිස ඒ සම්බන්ධයෙන් ලියකියවිලි ඉදිරිපත් කිරීමට සූදානම් විය යුතුයි.

3. මරදානේ දුම්රිය ගබඩා අධිකාරි තැනගේ කාර්‍යාලයෙන් ලබාගත හැකි පෝර්ම කොළවල ටෙන්ඩරය ලියා අනුපිටපතක් සහිතව එවිය යුතුය.

4. ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 250 ක් මරදානේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි තැනගේ කාර්‍යාලයේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1971 ජනවාරි 23 වෙනි දින දහවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

5. 1971 ජනවාරි 24 වෙනි ඉරිදා පෙරවරු 11.05 ට දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්‍යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

6. වැඩි විස්තර දුම්රිය ගබඩා අධිකාරි තැනගේ කාර්‍යාලයෙන් ලබාගත හැක.

ඇම්. සරීන්,
දුම්රිය සාමාන්‍යාධිකාරි වෙනුවට.

1970 දෙසැම්බර් 16 වෙනි දින,
කොළඹ දීය.

12-959—70.12.24 දින අංක 14,938 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### බදුල්ල සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශය

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයන් හා සේවා.**—වර්ෂ 1971 ජනවාරි 15 වැනිද සිට 1971 දෙසැම්බර් 31 වැනිද දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලය තුළ මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන් ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සිල් තබන ලද ටෙන්ඩර් පත්‍ර බදුල්ලේ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කාර්‍යාලයේදී සෞඛ්‍ය සේවා අධිකාරි විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුය. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමූපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලට ද, තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්ලිය හැක. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිළිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්‍යාලයයෙන් හෝ අනුරාධපුර, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුර සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්‍යාලවලින් ලබාගත හැක. නියමිත ආකෘති පත්‍රයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගෙන ඒවා අවසාන දිනයට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි ආකෘති පත්‍ර සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල් වේලා ඇතිව එවිය යුතුය.

3. **වත්කමේ විස්තර.**—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් ආකෘති පත්‍ර සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට සැලකිය යුතු කාලයකට පෙර තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පත්‍ර ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දැන්විය යුතුය. මේ සඳහා වුවමනා ආකෘති පත්‍ර ඉහත පෙනෙන දෙවන ඡෙදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි වීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දැන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැනගැනීමට මේ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා '' සෞඛ්‍ය සේවා අධිකාරි, බදුල්ල '' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා දැයි පැහැදිළිව සඳහන් කළ යුතුවාක් මෙන්ම, එහි වම් පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිළිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්‍යාලයයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරි/ලේකම් ට භාරදෙන්නේ නම් ටෙන්ඩර් පත්‍රිකා ලැබුන බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුය.

6. **ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වැනි තීරයේ සඳහන් දිනයන්හි පෙ.ව. 10ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්‍යාලයයේ දී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩරයන්හි තීරණය.**—ටෙන්ඩර් පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර් කරු විසින් පෝර්මයේ '' බී '' උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයෙහි '' සී '' උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳ පොලේ පවතින මිළ ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් පවතී නම්, එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

8. **ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීම.**—ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවට ටෙන්ඩර් කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද, පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරු කර ගැනීමට මා සමග කලින් පිළියෙල කරගත් දිනයක මවිසින් හෝ බලය පවරනු ලැබූ මාගේ නියෝජිතයකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරික්ෂා කළ හැකිය.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමු වන ඡෙදයේ සඳහන් කාලසීමාව ඉකුත් වන තුරු වළංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයේ 3 වැනි තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩු බාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩා කර තබාගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම් තුළ ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන් විමට බලාපොරොත්තු වන්නන්, එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම, පිළිපැදිය යුතු ද වන්නේ ය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුම් කොන්දේසි ද ටෙන්ඩර් කරුවන් විසින් සැලකිය යුතුය.

වෛද්‍ය සී. ඩී. හේරත්,
බදුල්ල සෞඛ්‍ය සේවා අධිකාරි.

1970 දෙසැම්බර් 15 ද,
බදුල්ල, සෞ. සේ. අධිකාරි කාර්‍යාලයේ දී ය.

## උපලේඛනය

| (1) | (2) | (3) | (4) | (5) | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ආයතනය | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල | ඇප මුදල | ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය | ආහාර ප්‍රමාණය දළ වශයෙන් | | | | | | | |
| | | | | සේවකයින්ට | | | | නොගෙවන ලෙඩුන්ට | | | |
| | රු. | රු. | | මාලු | මස් | කරවල | එළවළු | මාලු | මස් | කරවල | එළවළු |
| 1. හල්දුම්මුල්ල මා. නි. ... | 100... | 400 | 1971. 1.12 පෙරවරු 10 ට | 100... | 150... | 200... | 800... | 200... | 300... | 400... | 1,800 |
| 2. ඇටම්පිටිය මා. නි. ... | 100... | 400 | | 200... | 200... | 200... | 800... | 400... | 400... | 400... | 1,700 |
| 3. හිඟුරුකඩුව මා. නි. ... | 100... | 400 | | 160... | 160... | 180... | 700... | 80... | 70... | 60... | 280 |
| 4. වැවේගම මා. නි. ... | 100... | 400 | | — ... | 150... | 250... | 500... | — ... | 200... | 400... | 800 |

12-893—70.12.24 දින අංක 14,938 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1971 ජනවාරි මස 15 වැනි සිකුරාදා පෙ. ව. 10.30 වනතෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර ගම්පහ අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාර ගනු ලැබේ:—

| පාඨශාලාවේ නම | වැඩයේ ස්වභාවය |
|---|---|
| 1. කොළ/තරාල කනිෂ්ඨ විද්‍යාලය | ගොඩනැගිලි අළුත්වැඩියාව |
| 2. කොළ/කුරුවමුල්ල මහා විද්‍යාලය | ගොඩනැගිලි වැඩි දියුණුව |
| 3. කොළ/මාබෝලෙ මුස්ලිම් විද්‍යාලය | පන්තිකාමර ගොඩනැගිල්ල (100′ × 20′) |

**සංලක්ෂය :** කොළ/කොළඹ උතුරු දිස්ත්‍රික්කය.

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ හෝ ගම්පහ අධ්‍යාපන කාර්යාලයේ හෝ එක් වැඩක් සඳහා රු. 100 බැගින් මුදල් තැන්පත් කර එම කුවිතාන්සිය ගම්පහ, ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් පහත සඳහන් මුදල්වලට හෝ ඊට වැඩි මුදලකට හෝ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1971 ජනවාරි මස 13 වැනි බදාදා දවල් 12 දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. (වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000 කට අඩු වැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නොවෙත්) චෙක්පත්, මුදල් ඇනවුම්, තැපැල් ඇනවුම් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ ගම්පහ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ ගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියා පදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක්ය.

**අවශ්‍ය ලියාපදිංචිය :**

අංක 1 සඳහා රු. 15,000 හෝ ඊට වැඩි ගණනකට

අංක 2 සඳහා රු. 5,000 හෝ ඊට වැඩි ගණනකට

අංක 3 සඳහා රු. 25,000 හෝ ඊට වැඩි ගණනකට.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති අනුමත සමිතිවලටද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එව්ය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍ය වේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි ගම්පහ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියළු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදියද බලා ගත හැක. තැපැලෙන් එවන ටෙන්ඩර් පත් ලියාපදිංචි තැපැලෙන් ගම්පහ අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එව්ය යුතුය. තැපැලෙන් නොඑවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පුද්ගලිකව ගම්පහ අධ්‍යාපන කාර්යාලයේ කාර්යාල සහකාර වෙත භාර දිය යුතුයි. එසේ භාර දුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

5. 1971 ජනවාරි මස 15 වැනි සිකුරාදා පෙ. ව. 10.30 ට ගම්පහ අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා මිල ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර්පත් භාර ගැනීම අවසන් කළ දින සිට සති හයක් ගතවන තුරු තමන් සඳහන් කරන ලද මිල ගණන් වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමති විය යුතුයි.

7. තවත් අවශ්‍ය විස්තර වෙතොත් ගම්පහ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගේ කාර්යාලයෙන් ලබා ගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂා කර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 66. 9. 30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව, කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියා පදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

ඊ. වී. අබේසේකර,
ගම්පහ ප්‍රදේශයේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1970 දෙසැම්බර් මස 16 වැනි දින,
ගම්පහ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදීය.

12-958—70.12.24 දින අංක 14,938 දරන ගැසට් පත්‍රය

---

## 1971.2.1 වෙනි දින සිට 1971.9.30 වෙනි දින දක්වා කාලය තුල රාගම, මහර බන්ධනාගාරයට සහ වතුපිටිවෙල තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලයට ගවමස්, පිකුදු ආදිය (උප ලේඛන " ආ ") සැපයීම

1971.2.1 වෙනි දින සිට 1971.9.30 වෙනි දින දක්වා කාළය තුල ඉහත සඳහන් බන්ධනාගාරවලට ගවමස් සහ පිකුදු ආදිය (උප ලේඛන " ආ ") සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් (" ලාංකික " යනුවෙන් අදහස් කරන්නේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචිකරවා ගැනීමෙන් හෝ රටවැසියෙක් වූවෙකි) ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. සියලුම ටෙන්ඩර් පත්‍ර අනුපිටපතක් සහිතව ලියුම් කවරයක දමා සීල් තබා " සභාපති , ටෙන්ඩර් මණ්ඩලය, බන්ධනාගාර දෙපාර්තමේන්තුව " කියා එව්ය යුතුය.

3. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් එව්ය යුතුය. රෙජිස්ටර් තැපෑලෙන් නොඑවන ටෙන්ඩර් පත්‍ර ටෙන්ඩර් කරුවා විසින් හෝ ඔහුගේ නියෝජිතයකු විසින් හෝ කොළඹ බන්ධනාගාර මූලස්ථානයේ වැඩ බලන නියෝජ්‍ය බන්ධනාගාර කොමසාරිස් ඊ. ඒ. එස්. ඩබ්ලිව්. පෙරේරා මහතාට භාරදී එය ලැබුනු බවට ලියවිල්ලක් ලබාගත යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර බහාලූ කවරයේ වම් පැත්තේ උඩ කෙළවරේ "......... බන්ධනාගාරයට .....................සැපයීමේ ටෙන්ඩරය " කියා ලියා මෙහි 8 වැනි වගන්තියේ සඳහන් දින පෙරවරු 10.30ට ප්‍රථම බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමාට ලැබෙන සේ එව්ය යුතුයි. ටෙන්ඩර්කරුවනට වුවමනා නම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේ දී ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ. මෙහි 8 වැනි වගන්තියේ සඳහන් දින පෙරවරු 10.35ට කොළඹ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමාගේ කාර්‍යාලයේ දී ඒවා විවෘත කරනු ලැබේ.

5. ටෙන්ඩර් පෝර්ම කොළඹ 9, බේස්ලයින් පාරේ පිහිටි බන්ධනාගාර කොමසාරිස්තැනගේ ප්‍රධාන කාර්‍යාලයෙන් ලබාගත හැක. නියමිත පෝර්මයේ ලියා නැති ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ.

එක් එක් බන්ධනාගාරය වෙනුවෙන් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ ඒ ඒ බන්ධනාගාරය වෙනුවෙන් ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනයට (8 වෙනි ඡේදය බලන්න) පෙර දින ප.ව. 3.30 දක්වා පමණි.

6. ටෙන්ඩර් භාර ගැනීම නැවැත්වූ දින සිට මාස 3ක් යනතුරු ටෙන්ඩර් කරුවන් තම ටෙන්ඩර් පත්‍ර සැලකිල්ලට භාජන කිරීමට ඉඩ දිය යුතුයි.

7. ටෙන්ඩර්වල සියළුම වෙනස් කිරීම් සහ මැකීම්වලට ටෙන්ඩර්කරු විසින් තමාගේ කෙටි අත්සන යෙදිය යුතුයි.

8. මෙහි පහත සඳහන් පරිදි, ටෙන්ඩර් පත්‍ර සඳහා මුදල් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්‍යාලයේ හෝ කච්චේරියක (කොළඹ කච්චේරිය හැර) තැන්පත් කොට එම කුවිතාන්සිය ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ.

යමෙකුට ටෙන්ඩරය පිළිගත් බව ලියමනකින් දන්වනු ලැබීමෙන් දින 10ක් ඇතුළත කොන්ත්‍රාත්තුවකට හා පොරොන්දුවකට බැඳීමට හෝ අවශ්‍ය ඇප මුදල් ඉදිරිපත් කිරීමට හෝ නුපුළුවන් විනි නම්, තැන්පත් කරන ලද මුදල් රාජසන්තක වෙනවාත් සමගම රජය සම්බන්ධ කවර කොන්ත්‍රාත්තුවකට හෝ බැඳීමට නොහැකි වනසේ ඔහුගේ නම කොන්ත්‍රාත් කඩ කරන්නන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනවා ඇත.

තවද, කොන්ත්‍රාත්තු කඩ කිරීමේ අලාභ වශයෙන් ලංකාවේ මුදලෙන් රු. 2,500ක් රජය වෙනුවෙන් බන්ධනාගාර කොමසාරිස්වරයාට ගෙවීමට එම ටෙන්ඩර්කරුවාට සිදුවනවා ඇත. මෙම අලාභ මුදල නීති මගින් අයකර ගැනීමේ බලය බන්ධනාගාර කොමසාරිස්වරයා වෙත පැවරී ඇත.

ටෙන්ඩර් භාරගත් බව දැක්වෙන නිවේදනය ටෙන්ඩර්කරු විසින් දෙන ලද ලිපිනයට තැපැලෙන් යවනු ලැබුවහොත්, නැත් නම් එහි ගෙන ගොස් භාර දුනහොත් එම නිවේදනය ලැබුණු ලෙස සලකනු ලැබේ. අන්‍ය සියළු තැන්පත් මුදල් කොන්ත්‍රාත්තුවට අත්සන් තැබීමෙන් පසු ආපසු දෙනු ලැබේ.

| උප ලේඛන " ආ " | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල | ඇප මුදල | ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා විවෘත කරන දිනය |
|---|---|---|---|
| | රු. | රු. | |
| මහර බන්ධනාගාරය | ... රු. 100 | ... රු. 1,500 | 16.1.1971 |
| වතුපිටිවෙල ත.ව.අ.වි. | ... රු. 50 | ... රු. 300 | |

9. එක් එක් බන්ධනාගාරය සඳහා තැන්පත් කරනු ලබන මුදල වෙනුවෙන් වෙන වෙනම කුවිතාන්සි ලබාගත යුතු බවත්, ඉදිරිපත් කරන මිළ ගණන් ඉලක්කමෙන් මෙන් වචනයෙන් ද සඳහන් කළ යුතු බවත්, එසේ ම, එම ගණන් වචනයෙන් සඳහන් නොවන ටෙන්ඩර් ප්‍රතික්ෂෙප විය හැකි බවත්, ටෙන්ඩර්කරුවන්ගේ විශේෂ සැලකිල්ලට භාජන කරවනු ලැබේ.

10. ටෙන්ඩර් පිළිගැනීමෙන් පසු එසේ පිළිගනු ලැබූ ටෙන්ඩර්කරුවන් එම කොන්ත්‍රාත්තුව මැනවින් ඉටු කරන බවට ඔවුන් වෙනුවෙන් ඇප කරුවන් වශයෙන් පෙනී සිටීමට කැමති වගකිව යුතු පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් ඉදිරිපත් කළ යුතු ය.

11. ඒ ඒ කොන්ත්‍රාත්තුව මැනවින් ඉටු කරන බවට සුදුසු ඇපකරුවන් පොරොන්දු පත්‍රයකින් බැඳීම අවශ්‍ය ය. තැන්පත් කළ යුතු අවශ්‍ය ඇප මුදල් ප්‍රමාණයන් මෙහි 8 වැනි වගන්තියේ සඳහන්ව ඇත. අවශ්‍ය සියලුම විස්තර මෙම දැන්වීමේ 5 වෙනි ඡේදයේ සඳහන් කාර්‍යාලයෙන් ලබාගත හැක.

12. ඒ ඒ ටෙන්ඩර් සඳහා ඇති සියලුම කොන්දේසි සම්පූර්ණයෙන් ඉටු වී නොමැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ගැන සලකා බලනු නො ලැබේ.

13. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියලුම ටෙන්ඩර් හෝ සම්පූර්ණයෙන් ප්‍රතික්ෂෙප කිරීමේ හා ඕනෑම ටෙන්ඩරයක් කොටස් වශයෙන් පිළිගැනීමේ අයිතිවාසිකම් මුළුමනින්ම ටෙන්ඩර් මණ්ඩලය වෙත තබා ගනු ලැබේ.

14. ටෙන්ඩර් මණ්ඩලයේ අවසරය නොමැතිව කිසිම කොන්ත්‍රාත්තුවක් වෙන කෙනෙකුට පැවරීම හෝ අතුරු බදු වශයෙන් දීම හෝ කළ නො හැක. කොන්ත්‍රාත්කරුවකු වෙනුවෙන් කොන්ත්‍රාත්තුව ඉටු කිරීමේ අයිතිය වෙන කෙනෙකු වෙත පවරමින් දෙන ලද ඇටෝර්නි බලය පිළිනොගෙන ප්‍රතික්ෂෙප කිරීමේ බලය රජය සතුය.

15. ඒ ඒ බන්ධනාගාර අධිකාරීන්ට සෑහෙන තරම් කරුණු තිබේ නම් කොන්ත්‍රාත්කරු විසින් වැඩෙහි යොදවනු ලබන යමකු ගැන තම විරුද්ධත්වය ලියවිල්ලකින් දැනුම් දිය හැක. එවැනි කිසිම කෙනෙකු කොන්ත්‍රාත්කරු විසින් වැඩෙහි යෙදවිය යුත්තේ, ලාංකිකයන් පමණකි.

16. මීට ප්‍රථම රජයේ කොන්ත්‍රාත්තුවක් භාර නොගත් ටෙන්ඩර් කරුවෙක් ටෙන්ඩර් පත්‍ර ඉල්ලා සිටීමේ දී තම සම්පූර්ණ නම, ස්ථිර ලිපිනය, තමන්ට අයිති ඉඩකඩම්, දේපොල ආදිය පිහිටි දිස්ත්‍රික්කය හෝ කොට්ඨාශය සඳහන් කොට, තමා පදිංචි පළාතේ ආදයම් පාලකතැන විසින් සහතික කරන ලද රපෝර්තුවක් එවිය යුතු ය. දේපොල විස්තර ද සඳහන් කළ යුතුය.

මීට ප්‍රථම මෙම දෙපාර්තමේන්තුව වෙනුවෙන් කොන්ත්‍රාත්තු ඉටු කරන ලද කොන්ත්‍රාත්තුකරුවකු නිවේදනයේ සඳහන් ටෙන්ඩර් කැඳවනු ලබන කොට්ඨාශයේ හෝ පළාතේ හැර ඉල්ලුම් කරනු ලබන්නේ නම් කුමන කොට්ඨාශයක හෝ කොට්ඨාශවල එම කොන්ත්‍රාත්තු තමා ඉටුකර ඇද්දැයි සඳහන් කළ යුතුය.

17. ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින බන්ධනාගාර කොමසාරිස් වරයා සමග කොන්ත්‍රාත්තුවකට අත්සන් තැබිය යුතුය. එබඳු නිළධාරියකුගේ පදවි නාමයෙන් අදහස් කළ යුත්තේ ද, ගිණිය යුත්තේ ද ලංකාණ්ඩුව යටතේ දැනට එම පදවිය දරන්නා වූ නිළධාරියා ද ඔහුගෙන් පසුව එම පදවිය දරන්නා වූ නිළධාරියා ද වේ.

18. මේ පිළිබඳ වැඩි විස්තර බන්ධනාගාර කොමසාරිස්වරයාගේ කාර්‍යාලයෙන් ලබාගත හැක.

ඒ. ඒ. ද සිල්වා,
වැඩබලන බන්ධනාගාර කොමසාරිස්.

1970 දෙසැම්බර් 16 වැනි දින,
කොළඹ 9,
බන්ධනාගාර මූලස්ථානයේ දී ය.

12—892—70.12.24 දින අංක 14,938 දරන ගැසට් පත්‍රය

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට මුද්‍රිත දුඹුරු කඩදාසි මළු 6,00,000 (ලක්ෂ 6) ක් සැපයීම හා ගෙනැවිත් බාරදීම සඳහා ටෙන්ඩර් ඉල්ලුම් පත්, කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ, බී. එස්. එස්. අයි. ගොඩනැගිල්ලේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1971 ජනවාරි මස 17 වන දින අ. භා. 2.30 දක්වා බාරගනු ලැබේ. අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක රු. 100ක මුදලක් තැන්පත් කොට, ඊට ලැබෙන කුවිතාන්සිය කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ, බී. එස්. එස්. අයි. ගොඩනැගිල්ලේ පිහිටි අලෙවි කිරීමේ කොමසාරිස් කාර්‍යාලයට ඉදිරිපත් කිරීමෙන් 1971 ජනවාරි මස 17 දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. ටෙන්ඩර් ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

වැඩි විස්තර අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් ලබාගැනීමට පිළිවන.

ඇන්. වාමදේව,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1970.12.16 දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව.

12–891—70.12.24 දින අංක 14,938 දරන ගැසට් පත්‍රය

## ශ්‍රීපාදස්ථාන මාර්ගය දෙපස රජයේ ඉඩම් තාවකාලික වෙළඳ සැල් (කඩ) සඳහා බදු දීම 1970-71

මස්කෙළිය හරහා ශ්‍රීපාදස්ථානයට යන මාර්ගයේ දෙපස තිබෙන මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රජයේ ඉඩම් 1970-71 වන්දනා කාලයේදී තාවකාලික වෙළඳ සැල් (කඩ) පැවැත්වීම සඳහා බදු දීම පිණිස මුද්‍රාව (සීල්) තබන ලද ඉල්ලුම්පත්‍ර (ටෙන්ඩර්) 1971 ජනවාරි මස 10 වෙනි දින පෙරවරු 11.30 දක්වා මහනුවර දිස්ත්‍රික්කයේ දිසාපති විසින් භාරගනු ලැබේ.

2. "ශ්‍රීපාදස්ථානයට යන මාර්ගයෙන් වෙළඳ සැල් දැමීම සඳහා" යන වැකිය ලියුම් කවරයේ වම්පස මුදුනේ ලිවිය යුතුය. තවද, මෙහි පහත උපලේඛනයේ සඳහන් එක් එක් ඉඩම් කැබැල්ල වෙනුවෙන් වෙන වෙනම ඉල්ලුම්පත්‍ර ඉල්ලුම් කරන ඉඩම් කැබැල්ල පැහැදිලිව සඳහන් කොට ඉදිරිපත් කළ යුතුය.

3. ඉල්ලුම්පත්‍ර ලියා පදිංචි තැපැලෙන් එවිය යුතුය. නැතහොත් කච්චේරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

4. ටෙන්ඩර් ඉදිරිපත් කළ යුත්තේ ඒ සඳහා නියමිත පෝර්මයේ ය. ඉල්ලුම් කරන එක් එක් ඉඩම් කැබැල්ලක් සඳහා රු. 50 ක මුදලක් මෙම කච්චේරියේ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලැබෙන කුවිතාන්සිය මෙම කාර්යාලයට ඉදිරිපත් කිරීමෙන් අවශ්‍ය ටෙන්ඩර් පෝර්ම ලබා ගත යුතුය.

5. ඉල්ලුම් පත්‍රයෙහි මැකීමක් කොට හෝ වැරදක් කොට හෝ වරදක් නිවැරදි කොට ඇතොත් ඒ ස්ථානයෙහි ඉල්ලුම්කරුගේ කෙටි අත්සන යෙදිය යුතුය. ඉල්ලුම් කරන බදු මුදල අකුරෙන් සහ ඉලක්කමෙන් සඳහන් කළ යුතුය. යම් හෙයකින් අකුරෙන් සඳහන් මුදල ඉලක්කමෙන් සඳහන් කළ මුදලට වෙනස් වේ නම් නිවැරදි සේ පිළිගනු ලබන්නේ අකුරෙන් සඳහන් මුදලය.

10. ගිවිසුම් පත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත් කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි.

11. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියළුම මිළ ගණන් යටත් පිරිසෙයින් සති තුනකටවත් වෙනස් නොවන ඒවා විය යුතුයි.

12. කිසියම් ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ලම හෝ ප්‍රතික්ෂෙප කිරීමේත් කිසියම් ටෙන්ඩරයක කොටසක් පමණක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ තුමා සතුය.

13. පත් කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින්, මෙම කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩ කරවා ගැනීමට පුහුණු හා නුපුහුණු හා දෙවගීයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතු අතර, ඔව්හු පමණක් එසේ නියුක්ත කළ යුතුයි. ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

කොන්ත්‍රාත්තුවේ 'මේ කොන්දේසිය සපුරාලීමට කොන්ත්‍රාත්තුකරුවා යම්කිසි විදියකින් අසමත් වුවහොත්, කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩු දෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එළැඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවලදී කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ සථිර ලේකම් වරයාගේ එකඟත්වය ඇතිව, නිශ්චිතව ලියවිල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැක. එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම, තහනම් වන අතර, එය කොන්ත්‍රාත්තුව කඩකිරීමක් ලෙස සළකනු ලැබේ.

මෙම කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා "ලාංකික" යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු අදහස් කෙරෙන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුලත් වෙයි.

මෙම කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණ වූද, කම්කරුවනට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බලපවත්වන සහ මින් මතු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසිවලට අනුකූලවූද වේතනයන් ගෙවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතුයි.

කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පත පොත, චැක්රෝල් පොත්, පෙරෙට්ටු පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් විධිමත්ව බලය දෙනු ලැබූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩ දීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

14. පෞද්ගලිකව ටෙන්ඩර්කරු වෙත භාරදෙන ලද හෝ ටෙන්ඩර් පත්‍රයේ සඳහන් ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් යවන ලද හෝ ටෙන්ඩරයට අදාල සෑම දැන්වීමක්ම ටෙන්ඩර්කරු අතට පත් කළායේ සළකනු ලැබේ.

15. 1934 වර්ෂයේ අංක 19 දරණ කම්කරු ආඥාපනතේ (117 වන අධිකාරිය) යටතේ සේවයෙහි යොදන ලද කම්කරුවෙකු විසින් හෝ කම්කරුවෙකු වෙනුවෙන් ඉල්ලනු ලබන වන්දියකින් කොන්ත්‍රාත්කරු විසින් රජය නිදහස් කළ යුතුයි.

16. ටෙන්ඩර්කරු විසින් වැඩට ගන්නා යම් සේවකයෙකු සේවයේ යෙදවීම අහිතකර දෙයක් ලෙස සළකා ඊට විරෝධය දැක්වීමේත් යම් සේවකයෙකු සේවයේ යෙදවීමට කලින් විරුද්ධ වීමේත් බලය රජය සතු වන්නේ ය.

17. වැඩ පැහැර හරින කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ රජය මගින් තබා ඇති ලේඛනයේ තනි තනිව හෝ ලේඛනයේ නම් සඳහන් වෙනත් අයෙකුගේ නම සමග හෝ ඇතුළු වී සිටින යම් පුද්ගලයෙකු සමග හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාට හැඟී යන හේතු නිසා හෝ කොන්ත්‍රාත්තුව භාරදීම නුසුදුස්සෙකු ලෙස සළකා ඔහු විසින් විරෝධය දක්වන කිසිවෙකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

18. මේ පිළිබඳව වැඩි විස්තර බතලගොඩ/වාරියපොල රජයේ ගොවි පළවල කළමනාකරුවන්ගෙන් දැනගත හැකිය.

ඇම්. ඇල්. සී. ඉලංගකෝන්,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (කෘෂිකර්ම ගොවිපල්).

1970 දෙසැම්බර් 14 වන දින,
පේරාදෙනියේ දීය.

12–914—70.12.24 දින අංක 14,938 දරන ගැසට් පත්‍රය

---

# බඩු බාහිරාදිය විකිණීම්

## පොලිස් දෙපාර්තමේන්තුව

පාවිච්චියට නුසුදුසු පහත සඳහන් බඩු 1970 දෙසැම්බර් මස 28 වන සඳුදා පූ. භා. 9 ට අවිස්සාවේල්ල පොලිස් කාර්යාලයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**වෙන්දේසියේ විකුණන බඩු :**

| | | |
|---|---|---|
| 1. | හම් පටි | 8 |
| 2. | බෙරේ තොප්පි | 2 |
| 3. | පා පැදි සීට් | 1 |
| 4. | සපත්තු බුරුසු | 7 |
| 5. | රෙදි බුරුසු | 7 |
| 6. | උන්ඩලර | 8 |
| 7. | හම් සපත්තු ජෝඩු | 158 |
| 8. | බූට්ස් කුට්ටම් | 50 |
| 9. | කලු දිග මේස් ජෝඩු | 18 |
| 10. | ගට්යණ තොප්පි | 5 |
| 11. | කැන්වස් සපත්තු ජෝඩු | 5 |
| 12. | ප්‍රථමා. එතුම් පටි | 2 |
| 13. | ප්‍රථමා. ලාංජන | 3 |
| 14. | ප්‍රථමා. පොත් | 2 |
| 15. | කාකි හට කබා | 30 |
| 16. | කාකි කොට කලිසම් | 36 |
| 17. | කාකි කැලෑ කබා | 34 |
| 18. | කිට් රග් | 25 |
| 19. | ගුදිරි | 23 |
| 20. | පටීස් ජෝඩු | 18 |
| 21. | රබර් වැහි කබා | 2 |
| 22. | වැහි කබා පටි | 2 |
| 23. | කලු වැහි කබා | 5 |
| 24. | ඇල තොප්පි | 95 |
| 25. | හිස් බැරල් ගැ. 45 හේ | 2 |
| 26. | හිස් ගැ. 1 ටින් | 76 |
| 27. | හිස් ගැ. 4 ටින් | 18 |
| 28. | ග්‍රීස් මීඩියම් රාත්තල් | 20 |
| 29. | ග්‍රීස් හෙවි රාත්තල් | 28 |
| 30. | ග්‍රීස්පම්ප් රාත්තල් | 9 |
| 31. | හයි ප්‍රෙෂර් ගියර් තෙල් බෝතල් | 30½ |
| 32. | ලින්සීඩ් තෙල් බෝතල් | 17½ |
| 33. | ෂෙල් ටොක්ස් හිස් ටින් | 2 |
| 34. | XXL 30 තෙල් බෝතල් | 153 |
| 35. | XXL 40 තෙල් බෝතල් | 40 |
| 36. | H.P. 140 තෙල් බෝතල් | 50 |
| 37. | G.P. 20 තෙල් බෝතල් | 175½ |
| 38. | ශොක් ඇබසෝබර් තෙල් බෝතල් | 16 |
| 39. | " ඩී " 40 තෙල් බෝතල් | 96½ |
| 40. | වයින් ස්ප්‍රිතු බෝතල් | 14 |
| 41. | බත් දීසි ඔවල් | 2 |
| 42. | රෙදි යාර | 1 |
| 43. | ඉබි යතුරු | 12 |
| 44. | පටීස් ටේප් යාර | 4 |
| 45. | බයිසිකල් වැල්ව් ටියුබ් අහල් | 51 |
| 46. | දිග කලු මේස් ජෝඩු | 20 |
| 47. | බයිසිකල් | 3 |
| 48. | කැරම් ලෑලි | 1 |
| 49. | තඹ කල්දේරම් | 2 |
| 50. | දියපෙරණය හා ස්ථාමය | 1 |
| 51. | පැට්‍රෝමැක්ස් ලාම්පු | 1 |
| 52. | ඇලුමිනියම් බොයිලේරු | 1 |
| 53. | ඩිස්ටිල් වෝටර් බෝතල් | 2½ |
| 54. | ඇසිඩ් බෝරික් අවුන්ස | 5 |

වෙන්දේසියට පෙර අවිස්සාවේල්ල සහකාර පොලිස් අධිකාරි ගබඩාවේ දී මෙම බඩු පරීක්ෂා කර බැලිය හැකිය. වෙන්දේසිය අවසාන වූ විගසම මුදල් ගෙවීම සහ බඩු ඉවත්කර ගැනීම කළ යුතුයි.

සී. අම්බිකාපති,
සහකාර පොලිස් අධිකාරි,
අවිස්සාවේල්ල.

12–904 —70.12.24 දින අංක 14,938 දරන ගැසට් පත්‍රය

## ආයුර්වේද දෙපාර්තමේන්තුව

### සුන්බුන් හා අබලන් භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

කොළඹ, ආයුර්වේද මහරෝහලේ සුන්බුන්, අබලන් භාණ්ඩ, බෝතල් සහ ගෝනි 1971. 1. 16 දින පෙ. ව. 10ට කොළඹ 8, ආයුර්වේද දෙපාර්තමේන්තුවේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ගැනුම්කරුවන් වෙන්දේසි අවස්ථාවේදීම සම්පූර්ණ මුදල් ගෙවීමට සූදානමින් සිටිය යුතුය.

1971. 1. 16 දින ප. ව. 4 ට පෙර, ගැනුම්කරුවන් තමන් විසින් ලබාගන්නා ලද භාණ්ඩ ආයුර්වේද දෙපාර්තමේන්තු භූමියෙන් ඉවත් කරගත යුතුය. ආයුර්වේද කොමසාරිස්ගේ භාණ්ඩ පිළිබඳ වගකීම ගැනුම්කරුවන් වෙන්දේසියෙන් භාණ්ඩ ඉල්ලා ලබා ගැනීමෙන් පසු අහෝසි වේ.

වෙන්දේසියට ඇතුළත් භාණ්ඩ පිළිබඳ ලේඛනයක් එම අවස්ථාවේදී ප්‍රදර්ශනය කෙරේ.

ආයුර්වේද කොමසාරිස්.

70. 12. 10 වෙනි දින,
ආයුර්වේද දෙපාර්තමේන්තුවේදී ය.

12-880—70.12.24 දින අංක 14,938 දරන ගැසට් පත්‍රය

---

# විවිධ දැන්වීම්

## අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය විසින් පාඨශාලා භාවිතය පිණිස අනුමත කරන ලද පන්ති පොත් හා අතිරේක පන්ති පොත්වල සම්පූර්ණ ලේඛනය

1967 සිට මෙ වනතෙක් අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩල විසින් පාඨශාලාවන්හි භාවිතය සඳහා නිර්දේශ කරන ලදුව, අධ්‍යාපන අධ්‍යක්ෂතුමා/අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්තුමා විසින් අනුමත කරන ලද සිංහල පන්ති පොත් හා අතිරේක පන්ති පොත්වල සම්පූර්ණ නාම ලේඛණය පහත පළවේ.

2. අනුමත කරන ලද පොත් අතුරෙන් සුදුසු පොත් තෝරාගත යුත්තේ 1970 නොවැම්බර් 16 වෙනි දින අධ්‍යාපන අමාත්‍යාංශයෙන් නිකුත් කරන ලද '' වර්ෂ 1971 ජනවාරි 1 වෙනි ද සිට රජයේ පාසල්වල අනිවාර්‍යයෙන් භාවිත කළ යුතු පොත් '' සම්බන්ධයෙන් නිකුත් කර ඇති මූ. අ. 11/150 හා 1970.11.16 දින දරණ අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 180 දරණ චක්‍රලේඛණයෙනි.

3. අනුමතිය අවලංගු වූ හා මණ්ඩලය විසින් අනුමතිය අළුත් නොකරන ලද පන්ති පොත් හා අතිරේක පන්ති පොත් කපා හැර,දැනට වලංගුව පවත්නා පන්ති පොත් හා අතිරේක පන්ති පොත් පමණක් මෙ ලේඛණයට ඇතුළත් කරන ලද බව සැලකිය යුතුයි.

4. පොත්වල වලංගු කාලය විෂයයන් අනුව දක්වා ඇත. පහසුවෙන් දැන ගත හැකි වන පරිදි පොත්වල වලංගු කාලය අනුව විවිධ විෂයයන් යටතේ පොත් ලැයිස්තුව පිළියෙල කර ඇත. මෙහි සඳහන් කාල සීමාවෙන් පසුව පොතක් පාඨශාලා භාවිතය පිණිස වලංගු වන්නේ, යළිත් මණ්ඩලය විසින් එහි අනුමැතිය අළුත් කරනු ලැබුවහොත් පමණි.

5. අධ්‍යාපන දෙපාර්තමේන්තුව, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව හා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පළ කරන ලද පොත් හැර මෙ මණ්ඩලය විසින් නිර්දේශ නොකරන ලද පොත් පාඨශාලා භාවිතය පිණිස යෙදවීම වරදක් බව පාඨශාලා ප්‍රධානීන්ට දන්වා ඇත.

6. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව හා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පමුණුවන පාසල් පොත් හා පැරණි සාහිත්‍ය කෘතීන්ගේ නව සංස්කරණ, ගැට පද, සන්න, විවරණ, ශබ්ද කෝෂ, ප්‍රස්තාර ආදියට මණ්ඩලයේ අනුමතිය අවශ්‍ය නොවේ.

7. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, අධ්‍යාපන දෙපාර්තමේන්තුව හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් පළකරන ලද පාසල් පොත්වල නම්, මෙ ලේඛණයට ඇතුළත් නොවේ.

8. මෙහි නම් යෙදී ඇති පිළිවෙලින් පොත්වල අගය හෝ ප්‍රමුඛත්වය පිළිබඳ විශේෂයක් පළ නොවන බව සළකන්න.

බී. කේ. සුබසිංහ,
අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලයේ ලේකම්.

1970 දෙසැම්බර් මස 16 වන දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලයේ දී ය.

### භාෂාව හා රචනය

**අනුමතියේ වලංගු කාලය 1967.1.1 සිට 1971.12.31 දක්වා**

| පන්ති පොත් අංකය | පොතේ නම | ගත්කරුගේ නම | නියමිත පන්ති | ප්‍රකාශකයාගේ නම |
|---|---|---|---|---|
| 1 ... | රචනා මාර්ගය ... | පු. බ. බාලසූරිය ... | කණිටු පෙළ (8) ... | සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම |

### බුද්ධ ධර්මය

**අනුමතිය වලංගු කාලය 1971.1.1 සිට 1973.12.31 දක්වා**

| පන්ති පොත් අංකය | පොතේ නම | ගත්කරුගේ නම | නියමිත පන්ති | ප්‍රකාශකයාගේ නම |
|---|---|---|---|---|
| 1 ... | සදහම් මග—4 ... | ගරු නාරද හිමි ... | | සීමාසහිත ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට්ස් |
| 2 ... | සදහම් මග—5 ... | ගරු නාරද හිමි ... | | එම |
| 3 ... | පාඨශාලීය බුද්ධ ධර්මය—8 ... | එස්. එෆ්. ද සිල්වා, ඊ. ආර්. එරත්න, එස්. වනිගතුංග | | ශ්‍රී ලංකා ප්‍රකාශන සමාගම |

**අනුමතිය වලංගු කාලය 1970.1.1 සිට 1972.12.31 දක්වා**

| පන්ති පොත් අංකය | පොතේ නම | ගත්කරුගේ නම | නියමිත පන්ති | ප්‍රකාශකයාගේ නම |
|---|---|---|---|---|
| 4 ... | *බුදු සිරිත හා බුදු දහම ... | ගරු අත්තුඩාවේ රාහුල හිමි, ගරු අභංගම ධර්මාරාම හිමි | ... | රත්න පොත් ප්‍රකාශකයෝ |
| 5 ... | සම්බුද්ධාගමය 1 ... | ගරු වැලිවිටියේ සෝරත හිමි ... | ඉ. බා. ... | එම |
| 6 ... | එම 4 ... | එම ... | 4 ... | එම |
| 7 ... | එම 5 ... | එම ... | 5 ... | එම |
| 8 ... | පාඨශාලීය බුද්ධ ධර්මය ... | ඇස්.එෆ්.ද සිල්වා, ඊ.ආර්. එරත්න, එස්. වනිගතුංග | 5 ... | ශ්‍රී ලංකා ප්‍රකාශක සමාගම |
| 9 ... | එම ... | එම | 7 ... | එම |
| 10 ... | * එම ... | එම ... | අ.පො.ස.ප.(සා.) | එම |
| 11 ... | *ප්‍රඥාලෝකය හෙවත් ගෞතම බුද්ධ චරිතය | ගරු පලන්නොරුවේ විමලධම්ම හිමි | අ.පො.ස.ප.(සා) ... | එම |
| 12 ... | *දහම් මග ... | ගරු හේන්පිටගෙදර පියනන්ද හිමි ... | අ.පො.ස.ප.(සා) ... | සීමාසහිත කොළඹ ඇපෝතිකරීස් සහ සමාගම |

| පන්ති පොත් අංකය | පොතේ නම | ගත්කරුගේ නම | නියමිත පන්ති | ප්‍රකාශකයාගේ නම |
|---|---|---|---|---|

අනුමතියේ වලංගු කාලය 1969.1.1 සිට 1971.12.31 දක්වා

| | | | | |
|---|---|---|---|---|
| 13 | සම්බුද්ධාගමය | ගරු වැලිවිටියේ සෝරත හිමි | 2 | රත්නාකර පොත් වෙළඳ හල |
| 14 | සම්බුද්ධාගමය | එම | 3 | එම |
| 15 | බුද්ධ ධර්ම සංග්‍රහය | ගරු පණ්ඩිත තෙරිපැහැ සෝමානන්ද හිමි, පණ්ඩිත කුමාරදාස මුණසිංහ, ගරු පණ්ඩිත කඹුරුපිටියේ වන රතන හිමි, ඩී. සී. අබේපිටිය | අ.පො.ස.ප. | නන්දන ප්‍රකාශකයෝ |

අනුමතිය වලංගු කාලය 1967.1.1 සිට 1971.12.31 දක්වා

| | | | | |
|---|---|---|---|---|
| 16 | බුද්ධාගම | ජයසේකර අබේරුවන් | 2, 3, 4, 5 | සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම |
| 17 | *බුද්ධාගම | එම | 6, 7, 8 | එම |
| 18 | ධර්ම සංග්‍රහය | ගරු නාරද හිමි | අ.පො.ස.ප. | සීමාසහිත ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට් |
| 19 | *දහම් මඟ | ගරු හේන්පිටගෙදර පියනන්ද හිමි | 7 | සීමාසහිත කොළඹ ඇපොතිකරීස් සමාගම |

අනුමතිය වලංගු කාලය 1939.1.1 සිට 1971.12.31 දක්වා

පන්ති පොත්

| | | | | |
|---|---|---|---|---|
| 20 | සම්බුද්ධ දේශනාව | ගරු තලල්ලේ ධම්මානන්ද හිමි | උසස් පන්ති | අභය ප්‍රකාශකයෝ |

## අංක ගණිතය

අනුමතිය වලංගු කාලය 1967.1.1 සිට 1971.12.31 දක්වා

| | | | | |
|---|---|---|---|---|
| 1 | ජ්‍යෙෂ්ඨ අංක ගණිතය | පී. ද ඇස්. කුලරත්න | අ.පො.ස.ප. | සීමාසහිත ස්වභාෂා ප්‍රකාශකයෝ |
| 2 | ජ්‍යෙෂ්ඨ රත්න ගණිතය | එම | එම | එම |
| 3 | ජ්‍යෙෂ්ඨ ගණිත නවෝදය | ජේ. ඊ. ජයසූරිය | එම | සීමාසහිත මැක්මිලන් සහ සමාගම |

## වීජ ගණිතය

අනුමතියේ වලංගු කාලය 1967.1.1 සිට 1971.12.31 දක්වා

| | | | | |
|---|---|---|---|---|
| 1 | ජ්‍යෙෂ්ඨ වීජ ගණිතය | ජේ. ඊ. ජයසූරිය | අ.පො.ස.ප. | සීමාසහිත මැක්මිලන් සහ සමාගම |

## ජ්‍යාමිතිය

අනුමතියේ වලංගු කාලය 1967.1.1 සිට 1971.12.31 දක්වා

| | | | | |
|---|---|---|---|---|
| 1 | ජ්‍යෙෂ්ඨ ශීඝ්‍ර ජ්‍යාමිතිය | ජේ. ඊ. ජයසූරිය | අ.පො.ස.ප. | සීමාසහිත මැක්මිලන් සහ සමාගම |

## ඉතිහාසය

අනුමතියේ වලංගු කාලය 1971.1.1 සිට 1973.12.31 දක්වා

| | | | | |
|---|---|---|---|---|
| 1 | ලංකා හා ලෝක ඉතිහාසය | ඇස්. ඇෆ්. ද සිල්වා | 6 | ශ්‍රී ලංකා ප්‍රකාශක සමාගම |
| 2 | අපේ උරුමය—I | ආචාර්ය ජී. සී. මැන්දිස් | 6 | සීමාසහිත කොළඹ ඇපොතිකරීස් සමාගම |
| 3 | අපේ උරුමය—II | එස්. ඒ. පේක්මන්, ආචාර්ය ජී. සී. මැන්දිස් | 7 | සීමාසහිත කොළඹ ඇපොතිකරීස් සමාගම |

අනුමතියේ වලංගු කාලය 1970.1.1 සිට 1972.12.31 දක්වා

පන්ති පොත්

| | | | | |
|---|---|---|---|---|
| 4 | නූතන යුරෝපා ඉතිහාසය 1453–1661 | ජෝර්ජ් ඩබ්. සවුත්ගේට්, අනුවාදක : බී. ඇලෝයි ප්‍රනාන්දු | — | සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම |
| 5 | නූතන යුරෝපා ඉතිහාසය (1789–1960) | එම | — | එම |
| 6 | සංක්ෂිප්ත යුරෝපා ඉතිහාසය (1756–1945) | එම | — | එම |
| 7 | වර්තමාන ලංකාව (බ්‍රිතාන්‍ය යුග සහ නිදහස් ලංකාව) | ඇස්. ඇෆ්. ද සිල්වා, ඊ. ආර්. එරත්න | — | රත්නාකර පොත් වෙළඳ හල |
| 8 | වර්තමාන ලංකාව (පෘතුගීසි හා ඕලන්ද යුග) | එම | — | එම |
| 9 | ලංකා හා ඉන්දියානු ඉතිහාසය ආදි යුගයේ සිට ක්‍රි.ව. 1505 දක්වා | ඇල්. එච්. හොරස් පෙරේරා, ඇම්. රත්නසභාපති | — | සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම |

පන්ති පොත්

අනුමතියේ වලංගු කාලය 1967.1.1 සිට 1971.12.31 දක්වා

| | | | | |
|---|---|---|---|---|
| 10 | *නවීන ඉතිහාස කථා ලංකාව හා ලෝකය | ඇඩ්වින් රණවක | 6 | සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම |

## ඉතිහාසය—අතිරේක පන්ති පොත්

අනුමතියේ වලංගු කාලය 1967.1.1 සිට 1971.12.31 දක්වා

| | | | | |
|---|---|---|---|---|
| 11 | ලංකා ඉතිහාසයේ ප්‍රධාන බලවේග | ආචාර්ය ජී. සී. මැන්දිස් | — | සීමාසහිත කොළඹ ඇපොතිකරීස් සහ සමාගම. |

| පන්ති පොත් අංකය | පොතේ නම | ගත්කරුගේ නම | නියමිත පන්ති | ප්‍රකාශකයාගේ නම |
|---|---|---|---|---|

### භූගෝල විද්‍යාව

අනුමතියේ වලංගු කාලය 1971.1.1 සිට 1973.12.31 දක්වා

| | | | | |
|---|---|---|---|---|
| 1 | මූලික ලංකා–ලෝක හා භෞතික භූගෝල විද්‍යාව | එන්. වීරතුංග | අ.පො.ස. (සා) | සීමාසහිත එම්. ඩී. ගුණසේන සහ සමාගම |
| 2 | සිතියම කියවීමේ අභ්‍යාසය | ඇස්. එෆ්. ද සිල්වා | අ.පො.ස. (සා) | සීමාසහිත කොළඹ ඇපොතිකරීස් සහ සමාගම |

### භූගෝල විද්‍යාව

පන්ති පොත් — අනුමතියේ වලංගු කාලය 1967.1.1 සිට 1971.12.31 දක්වා

| | | | | |
|---|---|---|---|---|
| 3 | මානව භූගෝල විද්‍යාව | ඇස්. ඊ. සේනාරත්න | 6 | සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම |

පන්ති පොත් — අනුමතියේ වලංගු කාලය 1970.1.1 සිට 1972.12.31 දක්වා

| | | | | |
|---|---|---|---|---|
| 4 | *ලංකා භූගෝල විද්‍යාව | ඒ. ඩී. බැප්ටිස්ට් | — | සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම |

### භූගෝල විද්‍යාව—අතිරේක පන්ති පොත්

අනුමතියේ වලංගු කාලය 1970.1.1 සිට 1972.12.31 දක්වා

| | | | | |
|---|---|---|---|---|
| 5 | ලෝකය | ඩඩ්ලි ස්ටැම්ප්, අනුවාදක : ගුණපාල සේනාධීර, බුද්ධදාස සේනාධීර | — | සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම |
| 6 | සාමාන්‍ය සහ ප්‍රාදේශීය භූගෝල විද්‍යාව | ඒ. ඩී. බැප්ටිස්ට් | — | එම |

පන්ති පොත් — අනුමතියේ වලංගු කාලය 1967.1.1 සිට 1971.12.31 දක්වා

| | | | | |
|---|---|---|---|---|
| 7 | *ලෝක භූගෝල විද්‍යාව | ඇස්. ඇෆ්. ද සිල්වා | අ.පො.ස. | සීමාසහිත කොළඹ ඇපෝතිකරීස් සමාගම |
| 8 | *නවීන ලංකා භූගෝල විද්‍යාව | එම | එම | එම |

### ශාරීර විද්‍යාව හා ස්වස්ථතාව

අනුමතියේ වලංගු කාලය 1971.1.1 සිට 1973.12.31 දක්වා

| | | | | |
|---|---|---|---|---|
| 1 | ජ්‍යෙෂ්ඨ කායික විද්‍යාව හා ස්වස්ථතාව | දොස්තර කේ. ඩී. එෆ්. පියසිලි | අ.පො.ස.ප. | සීමාසහිත ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට් |

අනුමතියේ වලංගු කාලය 1970.1.1 සිට 1971.12.31 දක්වා

| | | | | |
|---|---|---|---|---|
| 2 | ශාරීරික විද්‍යාව හා ස්වාස්ථ්‍යය | සු. බ. බාලසූරිය | අ.පො.ස.ප. | සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම |

### ගෘහ විද්‍යාව

අතිරේක පන්ති — අනුමතියේ වලංගු කාලය 1970.1.1 සිට 1972.12.31 දක්වා

| | | | | |
|---|---|---|---|---|
| 1 | ගෘහ කර්මය | ඒ. විජයරත්න | — | සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම |

### උද්භිද විද්‍යාව

අනුමතියේ වලංගු කාලය 1967.1.1 සිට 1971.12.31 දක්වා

පන්ති පොත්

| | | | | |
|---|---|---|---|---|
| 1 | උද්භිද විද්‍යාව | ටී. රංජිත් රුබේරු | උසස් පන්ති | සීමාසහිත කොළඹ ඇපොතිකරීස් සමාගම |

### කෘෂිකර්ම විද්‍යාව

අතිරේක පොත් — අනුමතියේ වලංගු කාලය 1971.1.1 සිට 1972.12.31 දක්වා

| | | | | |
|---|---|---|---|---|
| 1 | කෘෂිකර්මය මූලධර්ම හා ව්‍යවහාර | ආචාර්ය ආර්. ආර්. අප්පදුරේ ආචාර්ය වයි. ඩී. ඒ. සේනානායක | — | සීමාසහිත ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට් |
| 2 | *විද්‍යාත්මක කෘෂිකර්මය (ප්‍රථම භාගය) | එච්. ඇම්. ගුණසේන | — | රත්නාකර පොත් වෙළඳ හල |
| 3 | *විද්‍යාත්මක කෘෂිකර්මය (ද්විතියික භාගය) | එම | — | එම |

### පාළි

පන්ති පොත් — අනුමතියේ වලංගු කාලය 1969.1.1 සිට 1971.12.31 දක්වා

| | | | | |
|---|---|---|---|---|
| 1 | පාළි පාඨමන්ජරී | ගරු පණ්ඩිත කහදමෝදර චන්ද්‍රකීර්ති ශ්‍රී පියරතන හිමි | — | සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම |

*මී ලඟ මුද්‍රණය සංශෝධනය විය යුතුයි.

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළ කරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩ කරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. **සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්‍යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

**සැ. යු.**—මුදල් ගෙවා ගැසට් පතෙහි පළ කරනු ලබන දැන්වීම් සඳහා අය විය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1970**

| මාසය | | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|
| දෙසැම්බර් | ... | 70.12. 4 සිකුරාද | ... | 70.11.27 සිකුරාද | දහවල් | 12.00 |
| | | 70.12.11 සිකුරාද | ... | 70.12. 4 සිකුරාද | දහවල් | 12.00 |
| | | 70.12.18 සිකුරාද | ... | 70.12.10 බ්‍රහස්පතින්ද | ප. ව. | 3.30 |
| | | 70.12.24 බ්‍රහස්පතින්ද | ... | 70.12.17 බ්‍රහස්පතින්ද | ප. ව. | 3.30 |
| | | 70.12.31 බ්‍රහස්පතින්ද | | 70.12.24 බ්‍රහස්පතින්ද | ප. ව. | 3.30 |

**1971**

| මාසය | | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|
| ජනවාරි | ... | 71. 1. 8 සිකුරාද | ... | 70.12.31 බ්‍රහස්පතින්ද | ප. ව. | 3.30 |
| | | 71. 1.15 සිකුරාද | ... | 71. 1. 8 සිකුරාද | ප. ව. | 3.30 |
| | | 71. 1.22 සිකුරාද | ... | 71. 1.15 සිකුරාද | ප. ව. | 3.30 |
| | | 71. 1.29 සිකුරාද | ... | 71. 1.22 සිකුරාද | ප. ව. | 3.30 |
| පෙබරවාරි | ... | 71. 2. 5 සිකුරාද | ... | 71. 1.29 සිකුරාද | ප. ව. | 3.30 |
| | | 71. 2.12 සිකුරාද | ... | 71. 2. 3 බදාද | ප. ව. | 3.30 |
| | | 71. 2.19 සිකුරාද | ... | 71. 2.12 සිකුරාද | ප. ව. | 3.30 |
| | | 71. 2.26 සිකුරාද | ... | 71. 2.19 සිකුරාද | ප. ව. | 3.30 |
| මාර්තු | ... | 71. 3. 5 සිකුරාද | ... | 71. 2.26 සිකුරාද | ප. ව. | 3.30 |
| | | 71. 3.12 සිකුරාද | ... | 71. 3. 3 බදාද | දහවල් | 12.00 |
| | | 71. 3.19 සිකුරාද | ... | 71. 3.10 බදාද | දහවල් | 12.00 |
| | | 71. 3.26 සිකුරාද | ... | 71. 3.17 බදාද | දහවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 දෙසැම්බර් 18 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රපිතයි